**මොනරාගල ප්‍රාදේශීය සභාව**

**2022.01.13 දින මහ සභා වාර්තාව**

මොනරාගල ප්‍රාදේශීය සභාවේ 2018 වර්ෂයේ නිළ කාලය ආරම්භ කිරීමෙන් පසුව පවත්වනු ලැබූ හතලිස් හයවන (46) සභා වාරය 2022.01.13 වන දින ප.ව 02.30 ට ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී ගරු සභාපති ආර්.එම්.රත්නවීර මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි. එහි සංෂිප්ත වාර්තාව පහත සඳහන් කරමි.

**පැමිණීම**

| | | |
|---|---|---|
| 01. ගරු සභාපති | - | ආර්.එම්.රත්නවීර මැතිතුමා |
| 02. ගරු උප සභාපති | - | ආර්.එම්.ප්‍රදීප් විජේරත්න මැතිතුමා |
| 03. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | වයි.උපුල් මැතිතුමා |
| 04. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඒ.ඩී.සුනිල් අරංගල මැතිතුමා |
| 05. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ආර්.එම්.ක්‍රිශාන්ත රත්නායක මැතිතුමා |
| 06. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.ජී.ඩී.චාමර නානායක්කාර මැතිතුමා |
| 07. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.එම්.ගුණවර්ධන මැතිතුමා |
| 08. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | රංජිත් රත්නායක මැතිතුමා |
| 09. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | තරංග දිසානායක මැතිතුමා |
| 10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | තමෝදිරම් ජයශීලන් මැතිතුමා |
| 11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | සන්ධ්‍යා අනුරුද්ධිකා රත්නායක මැතිතුමිය |
| 12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එස්.අතුලකුමාරසිරිමැතිතුමා (ප්‍රතිපක්ෂනායක) |
| 13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ප්‍රදීප් ධම්මික විතානගේ මැතිතුමා |
| 14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ආර්.එම්.රමණී රත්නායක මැතිතුමිය |
| 15. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ආර්.එම්.උදේනි රම්‍යලතා මැතිතුමිය |
| 16. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.මනෝජා ලක්මිණි මැතිතුමිය |
| 17. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එච්.එම්.සනත් ගුණවර්ධන මැතිතුමා |
| 18. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩබ්.එම්.පී.බණ්ඩාර මැතිතුමා |
| 19. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | අජිත් ශාන්ත අගලකඩ මැතිතුමා |
| සභා ලේකම් | - | ඩී.එම්.අනුර දිසානායක මහතා |

**නොපැමිණීම** - නැත

**පිළිගැනීම**

පළමුව ආගම සිහිකිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමා විසින් මාසික මහ සභාව සාර්ථක කර ගැනීම සඳහා පැමිණි ගරු උප සභාපතිතුමා, සියලුම මන්ත්‍රීවරුන්, මන්ත්‍රීවරියන් ඇතුළුව පැමිණ සිටින සියලු දෙනා පිළි ගනිමින් සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී.

## 01. පසුගිය මස සභා වාර්තාව සභා සම්මත කර ගැනීම.

මේ වන විටත් ඔබතුමන්ලාහට ලබා දී ඇති පසුගිය මාසික මහ සභාවේ සභා වාර්තා කෙටුම්පත කියවූවා සේ සලකා සංශෝධන ඇත්නම් ඒවා පෙන්වා දී සංශෝධන නැත්නම් ගරු සභාවේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත කර ගන්නා ලෙස ගරු සභාපතිතුමා විසින් ගරු සභාව වෙත දැනුම් දෙන ලදි. එහිදී සංශෝධන කිසිවක් ඉදිරිපත් නොවූයෙන් පසු ගිය මස මහ සභා වාර්තාව සුනිල් අරංගල ගරු මන්ත්‍රීතුමන්ගේ සහ කේ.එම්.ගුණවර්ධන ගරු මන්ත්‍රීතුමන්ගේ යෝජනා ස්ථිරත්වයෙන් මහ සභාවේ ඒකමතික එකඟතාවයෙන් සභා සම්මත කරන ලදි.

## 02. සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන

නැත

## 03. සභාව අමතා එවන ලද සංදේශ පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන සභාව වෙත ඉදිරිපත් කිරීම.

නැත

## 04. යථා පරිදී කල් දී ඇති ප්‍රශ්න සාකච්ඡා කිරීම

නැත

## 05. යථා පරිදී කල් දී ඇති යෝජනා සාකච්ඡා කිරීම

න්‍යායපත්‍රානුකූලව මීලඟට ඇත්තේ යථා පරිදී කල්දී ඇති යෝජනා සාකච්ඡා කිරීම හා සභා තීරණ ගැනීම බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටින ලදි.

### 05.1 ගරු සභාපති ආර්.එම්.රත්නවීර මැතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරනු ලබන යෝජනා

**යෝජනා අංක 01**

2021 වර්ෂයේ ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතිය මගින් ක්‍රියාත්මක කරන ලද කාර්යය සාධන ව්‍යාපෘතියට අදාලව පළාත් පාලන ආයතන මට්ටමින් සිදු කරනු ලැබූ කාර්යක්ෂමතාවය මැන බැලීමේ ප්‍රශ්නාවලියට අනුව මේ වන විට ප්‍රාදේශීය සභාව මගින් ක්‍රියාත්මක කර නොමැති ආදායම් උත්පාදන මාර්ග කාර්යක්ෂම කිරීම සඳහා පහතින් ඉදිරිපත් කරන නව යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා සභා අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදි.

I. බදු ගෙවන පාරිභෝගික ජනතාවගේ පහසුව වෙනුවෙන් online ක්‍රමයට බදු ගෙවීමට සහ බදු අය කිරීමට ක්ෂේත්‍රයට යන ක්ෂේත්‍ර කාර්යය මණ්ඩලයටත්, කාර්යාලයේ එම දත්ත අඛණ්ඩව පවත්වාගෙන යාමටත්,තොරතුරු තාක්ෂණ උපකරන හා ඊට අදාල මෘදුකාංග හදුන්වා දීම.හා පාරිභෝගික ජනතාවටත් කාර්යය මණ්ඩලයටත් ඒ සඳහා අවශ්‍ය පුහුණුව ලබා දීම.
II. ආදාහනාගාර භූමියේ මල් ශාලාවක් ඉදිකිරීම.
III. පෙර පාසල් පරිශ්‍රයේ දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
IV. ප්‍රජාශාලා භූමියේ භාහිර පන්ති පැවැත්වීමට සුදුසු ස්ථානයක් සකස් කිරීම.
V. වාහන සේදුම් ස්ථානයක් ආරම්භ කිරීම.
VI. ජල මීටර් සවි කර ජල ගාස්තු අය කිරීම විධිමත් කිරීම.
VII. හරිතාගාර ආශ්‍රිත භෝග තවාන් කර පැල විකුණුම් ස්ථානයක් පවත්වාගෙන යාම.(කොම්පෝස්ට් ව්‍යාපෘතිය ආශ්‍රිතව)
VIII. ආපන ශාලාවක් සහ කොමියුනිකේෂන් පහුකම් සහිත ස්ථානයක් පවත්වාගෙන යාම.(පොටෝකොපි,ලැමිනේටින්,දූරකථන)
IX. පුස්තකාල ආශ්‍රිතව පත්තරවලින් කරන නිෂ්පාදන පවත්වාගෙන යාම.
X. වල් කැපීම,තීන්ත ආලේප කිරීම,වයරින් කිරීම ආදී සේවාවන් සැපයීම.
XI. කුට්ටිගල්,සිලින්ඩර,ලිං වළලු සෑදීම සඳහා කොන්ක්‍රීට් වැඩපලක් පවත්වාගෙන යාම.

එම යෝජනාව සුදුසු බවට තමෝදිරම් ජයජීලන් ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඒ වගේම සභා තීරණයකට අනුව ආදාහනාගාර පරිශ්‍රයේ තාප්ප වල භෂ්මාවශේෂ තැන්පත් කිරීම සඳහා කබඩ් සකස් කර ඇති අතර එක් කබඩ් එකක් වෙන් කර දීමේදී අප විසින් අය කළ යුතු මුදල තීරණය කර ගත යුතු බවට ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින් ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතිය මගින් ක්‍රියාත්මක කරන ලද කාර්යය සාධන ව්‍යාපෘතියට අදාලව එම ප්‍රතිපාදන වලට යටත්ව ආදායම් උත්පාදනය කිරීමේ ව්‍යාපෘති වශයෙන් හඳුනා ගෙන ඇති මෙම ව්‍යාපෘතිය ප්‍රාදේශීය සභාව මගින් ක්‍රියාත්මක කිරීම සුදුසු බවත්, අදාල ප්‍රතිපාදන ලැබීමේදී ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන කමිටු වලට මෙම යෝජනා ගැලපෙන ආකාරයට යොමු කර, අවස්ථානුකූලව නැවතත් අධ්‍යනයන් සිදු කර කාලීනව ඉටු කිරීමට හැකි සුදුසු යෝජනා පමණක් තෝරාගනිමින් එම එක් එක් යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය නිර්දේශ ලබා දී ඒ සඳහා සැලසුම් සකස් කර ක්‍රියාත්මක කිරීමට සුදුසු කාල වලදී එම සැලසුම් සඳහා මහ සභා තීරණ ගෙන ක්‍රියාත්මක කිරීම සුදුසු බවට මහ සභාව ඒකමතිකව අනුමත කරන ලදී. එසේම ආදාහනාගාරයේ භෂ්මාවශේෂ තැන්පත් කිරීම සඳහා සකස් කර ඇති කබඩ් එක් අයෙකු වෙනුවෙන් එක් කබඩ් එකක් වෙන් කර දීමේදී රු.5000.00 (පන්දහසක) මුදලක් අය කිරීම සුදුසු බවටත් මහ සභාව ඒකමතිකව අනුමත කරන ලදී.

**යෝජනා අංක 02**

ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතිය (LDSP) යටතේ කියාත්මක වන කාර්යය සාධන ව්‍යාපෘති 2 අදියර (PPT 2nd stage ) යටතේ වෙන් කර ඇති මිලියන 10 යටතේ පහත ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම සඳහා සභා අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදි.

I. මොනරාගල නව බස් නැවතුම්පොළ භූමියේ කිලෝ වෝට් 40 ක ධාරිතාවයෙන් යුත් සූර්යය බලයෙන් ක්‍රියාත්මක වන පැනල් පද්ධතියක් සවි කිරීම.
II. 48-0660 දරන ගිලන් රථය අවමංගල්‍ය රථයක් ලෙස අලුත් වැඩියා කිරීම.
III. සභාව සතු පොදු ස්ථාන වල එනම් නව පොළ ,ක්‍රීඩා පිටිය,හරිත උද්‍යානය වැනි ස්ථාන වල සූර්ය බල මාර්ග විදුලි පහන් සවි කිරීම.

එම යෝජනාව සුදුසු බවට සුනිල් අරංගල ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතිය යටතේ කියාත්මක වන කාර්යය සාධන ව්‍යාපෘති 2 අදියර යටතේ වෙන් කර ඇති මිලියන 10 යටෙත් මෙම සංවර්ධන ක්‍රියාකාරකම් විධිමත් ක්‍රමවේදයන්ට යටත්ව ක්‍රියාත්මක කර පවත්වාගෙන යාම සුදුසු බවටත්, මෙහි සූර්ය බල මාර්ග විදුලි පහන් පොදු ස්ථාන වල සවි කිරීමේදී බිබිල පාර සභාවට අයත් ක්‍රීඩා උද්‍යානයටද අවශ්‍ය කරන විදුලි පහන් සවි කළ යුතු බවටත් මහ සභාව ඒකමතිකව අනුමත කරන ලදී.

**යෝජනා අංක 03**

2022 වර්ෂය සඳහා මොණරාගල ප්‍රාදේශීය සභාව විසින් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති කසළ කළමනාකරණ ක්‍රියාත්මක සැලැස්ම ( ඔබ වෙත ඉදිරිපත් කර ඇති) සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදි.

එම යෝජනාව සුදුසු බවට පී.බණ්ඩාර ගරු මන්ත්‍රිතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

2022 වර්ෂය සඳහා මොණරාගල ප්‍රාදේශීය සභාව විසින් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති මෙම කසළ කළමනාකරණ ක්‍රියාත්මක සැලැස්ම විධිමත් ක්‍රමවේදයන්ට යටත්ව ක්‍රියාත්මක කිරීම සුදුසු බවට මහ සභාව ඒකමතිකව අනුමත කරන ලදී.

**යෝජනා අංක 04**

මොනරාගල ප්‍රාදේශීය සභාව සතු කොම්පෝස්ට් ව්‍යාපෘතියේ ඇති විදුලි පද්ධතිය නිතර බිඳ වැටීම් වලට ලක්වන අතර දැඩි අනාරක්ෂිත තත්ත්වයක පවතින බැවින් කොම්පෝස්ට් ව්‍යාපෘතියේ විදුලි පද්ධතිය සම්පූර්ණයෙන් අලුත්වැඩියා කිරිම සඳහාත්, එසේම සේවක විවේකාගාරයේ හා ගබඩාවේ තීන්ත ආලේප කර පිලිසකර කර ගැනීමටත්, කොම්පෝස්ට් ව්‍යාපෘතියේ ඇති උද්‍යාන භූමියට කොන්ක්‍රීට් බංකු කිහිපයක් හා අවශ්‍ය වෙනත් ද්‍රව්‍ය මිලදී ගැනීමටත් ,ව්‍යාපෘතියේ කටයුතු සඳහා අවශ්‍ය උපකරණ එනම් උදලු ,විල්බැරැක්ක, සවල් වැනි උපකරණ මිලදී ගැනීම සඳහාත් මහා සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදි.

එම යෝජනාව සුදුසු බවට සුනිල් අරංගල ගරු මන්ත්‍රිතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.
සභාව සතු කොම්පෝස්ට් ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය වන මෙම අලුත්වැඩියා කටයුතු සහ අදාල මිල දී ගැනීම් විධිමත් ක්‍රමවේදයන්ට යටත්ව සහා අරමුදලින් සිදු කිරීම සුදුසු බවට මහ සභාව ඒකමතිකව අනුමත කරන ලදී.

**යෝජනා අංක 05**

මොණරාගල ප්‍රාදේශිය සභාවට අයත් නව බස්නැවතුම් පල පොදු වැසිකිළිය සහ නව පොළ භූමියේ පොදු වැසිකිලිය 2022 වර්ෂයට පහත සඳහන් පරිදි හතර වතාවක්ම ටෙන්ඩර් කළ අතර ඒ එකඳු අවස්ථාවකදීවත් මෙම දේපළ සඳහා අයදුම් පත් ඉදිරිපත් නොවූ අතර මෙම දේපළ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කිරීම සඳහා මහා සභාවේ තීරණය හා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදි.

| අනු අංකය | දේපල විස්තරය | පළමුවර ටෙන්ඩර් කළ මුදල | දෙවන වර ටෙන්ඩර් කළමුදල 5%ක් අඩු කර | තෙවන වර ටෙන්ඩර් කළ මුදල (දෙවන වර ටෙන්ඩර් කළ මුදලින් 10% ක් අඩුකර) | හතරවන වරට ටෙන්ඩර් කර මුදල (තෙවන වර ටෙන්ඩර් කළ අරමුදලින් 10% ක් අඩුකර) |
|---|---|---|---|---|---|
| 01 | නව බස්නැවතුම්පල පොදු වැසිකිළිය | 3,240,000.00 | 3,078,000.00 | 2,770,200.00 | 2,493,180.00 |
| 02 | නව පොළ භූමියේ පොදු වැසිකිලිය | 80,200.00 | 76,190.00 | 68,571.00 | 61,713.00 |

එම යෝජනාව සුදුසු බවට කේ.එම්.ගුණවර්ධන ගරු මන්ත්‍රීතුමන් විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ නැවත සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

මෙම යෝජනාව න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීමෙන් අනතුරුව යම් ඉල්ලුම්කරුවෙකු විසින් බස්නැවතුම් පල පොදු වැසිකිළිය සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද ඉල්ලීමක් සලකා බලා මෙම න්‍යාය පත්‍රයේම යෝජනා අංක 07 යටතේ ඇතුලත් කර ඇති බැවින් ඒ අනුව ද සභා තීරණයක් ගත යුතු බවට ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටින ලදී.

අවස්ථා හතරකදීම ටෙන්ඩර් කලද මෙම දේපල සඳහා ටෙන්ඩර් අයදුම්පත් ඉදිරිපත් වී නොමැති බැවින් රටේ පවතින තත්ත්වයත් සමග 2022 වර්ෂයට ද ජනවාරි 1 සිට දෙසැම්බර් 31 දක්වා යෝජනා අංක 07 යටතේ ඉල්ලීම් කර ඇති ඉල්ලුම්කරු වෙත දිනකට රුපියල් 5000.00 බැගින් වන පරිදි මාසිකව සභාවට බදු ගෙවීමේ පදනම මත කොන්දේසි සහිත ගිවිසුම් ප්‍රකාරව බස්නැවතුම්පොළ පොදු වැසිකිළිය භාර දීම සුදුසු බවට මහ සභාව තීරණය කරන ලදී. එසේම 2022 වර්ෂයට ටෙන්ඩර් නොගිය අනිකුත් පොදු වැසිකිළි සභාවේ කම්කරුවන් යොදවා නඩත්තු කටයුතු අඛණ්ඩව සිදු කරමින් ගාස්තු අයකර ගනිමින් බවත්වාගෙන යාමට කටයුතු කළ යුතු බවට මහ සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**යෝජනා අංක 06**

මොනරාගල නාගරික සංවර්ධන අධිකාරියේ නියෝජ්‍ය අධ්‍යක්ෂක විසින් දැනුම් දී ඇති පරිදි ඉදිරිපත් කර ඇති ලිපි ලේඛණ වලට අදාලව නාගරික සංවර්ධන අධිකාරියේ ප්‍රකාශිත බල ප්‍රදේශය පුළුල් කිරීම සඳහා මහ සභා අනුමැතිය ලබා දීම සඳහාත්, ඒ පිළිබඳව වැඩිදුරටත් කරුණු ඉදිරිපත් කිරීම සඳහා සභා වාරයට පැමිණීමට නියමිත නාගරික සංවර්ධන අධිකාරියේ නියෝජ්‍ය අධ්‍යක්ෂකවරියට ඒ සම්බන්ධයෙන් පැහැදිලි කිරීමට අවස්ථාවක් ලබාදීම සඳහාත් මහා සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදි.

එම යෝජනාව සුදුසු බවට සනත් ගුණවර්ධන ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

ගරු සභාපතිතුමා විසින් මහා සභාව කාරක සභාවක් බවට පත් කිරීමෙන් අනතුරු මේ සම්බන්ධයෙන් සම්පූර්ණ පැහැදිලි කිරීමක් මහා සභාවට ඉදිරිපත් කරන ලෙසට පැමිණ සිටි නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ තුමිය වෙත අවසර ලබාදෙන ලදී.

අනතුරුව මොනරාගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ නාගරික සංවර්ධන අධිකාරිය විසින් ප්‍රකාශිත බල ප්‍රදේශය පුළුල් කිරීම වෙනුවෙන් 2022 සිට 2032 කාලවකවානුවට අදාළව නාගරික සංවර්ධන අධිකාරිය, මොණරාගල දිස්ත්‍රික් කාර්යාලය මගින් මේ වන විට සකස් කරමින් පවතින සංවර්ධන සැලැස්ම ,පරිගණක තාක්ෂණය මගින් රූපරාමු සහිතව මහා සභාවට පූර්ණ පැහැදිලි කිරීමක් කර සිටින ලදි.

මෙහිදී ප්‍රදේශයේ අහිංසක දමිළ ජනතාව වැඩි කොටසක් ජීවත් වන අලියා වත්ත ග්‍රාම නිලධාරී වසම මෙම නඟර සංවර්ධන සැලැස්මට අයත් වන බැවින් එම ජනතාවට ඉදිරියට මුහුණ දීමට සිදුවන තත්ත්වය කුමක් ද යන්නත්, එම ජනතාවට කිසිදු අසාධාරණයක් සිදු නොවිය යුතු බවත් ගරු මන්ත්‍රී සුනිල් අරංගල මහතා විසින් ප්‍රකාශ කර සිටින ලදි .

එහිදී මරගල කන්ද ගැසට් කර ඇති බැවින් එම සීමාවට අයත් සියලු ප්‍රදේශ මෙම සැලැස්මට ඇතුලත් වන බව එම නිලධාරීතුමිය විසින් පැහැදිලි කර සිටින ලදි.

තවද වැලියාය ප්‍රදේශයෙන් මෙම සැලසුමට අයත් වන සීමාවට අනුව වැලියාය වාලන්ද ගල් කොරිය අසල සිට පාර දිගට ම ඇත්තේ සින්නක්කර ඉඩම් හිමියන් බවත්, කොලොන්වින්න විශාල සීමාවක් මෙම සැලැස්මට අනුව ඇති බැවින් පරම්පරා ගණනක් මිනිසුන් භුක්තිවිදින ඉඩම් වල ගස් කොලන් ආදී දේපල සඳහා මුල් අයිතිය ඇති අයටවත් වත් භුක්ති විදීමට නොහැකි වන අතර මෙම ඉඩම්වල ඉදිකිරීම් සිදු කිරීමේදී වුවද ආයතන කිහිපයකින් ම ඔවුන්ට අවසර ගැනීමට සිදුවීම ජනතාව මහත් අපහසුතාවයන්ට මුහුණ දීමට සිදු වන අවස්ථා බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටින ලදි.

මේ සම්බන්ධයෙන් නැවත මහා සභාවට පැහැදිලි කිරීමක් කර සිටි නාගරික සංවර්ධන අධිකාරියේ නියෝජිත තුමිය විසින් මහා සභාවෙන් ඉදිරිපත් කරන ලද මෙම ගැටළු සම්බන්ධයෙන් තම ආයතනයට වඩා මූලික වගකීම ඇත්තේ මධ්‍යම පරිසර අධිකාරියට බැවින් එම නිලධාරීන් සමඟ ද මේ සම්බන්ධව සාකච්ඡා කර නිරවුල් කරගත හැකි බව පවසා සිටින ලද අතර මෙම සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා සභා අනුමැතිය ලබා දෙන ලෙසත්, ඉන් අනතුරුව අදාල ව්‍යාපෘති ක්‍රියාත්මක කරන අවස්ථාවන් වලදී සාකච්ඡා මට්ටමින් යම් යම් වෙනස්කම් සිදු කර ගත හැකි බවත් සඳහන් කරන ලදි.

මෙහිදී ඉදිරියේ දී ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය නගර සභාවක් බවට පත් කිරීමට නියමිත බැවින් ඒ ඒ සඳහා අයත් සීමාවට සහ මෙම සැලසුමට අයත් සීමාව සමඟ බලපෑමක් තිබේද යන්න අතුල කුමාරසිරි ගරු මන්ත්‍රී තුමා විසින් විමසීම් කර සිටින ලදි.

එහිදී නගර සභා සීමාවට අයත් වන වරිපනම් සීමාව මෙම සැලැස්මට ගලපා නොමැති බැවින් ඒ සඳහා කිසිඳු බලපෑමක් සිදු නොවන බව එම නියෝජිත තුමිය විසින් විස්තර කර සිටින ලදි.

ඉදිරි සතියේම යම් දිනයක් යොදා ගෙන ප්‍රාදේශීය සභාවේ සියලුම මන්ත්‍රීවරුන් කැඳවා පරිසර අධිකාරියත් සමග සහ මේ සඳහා වග කිව යුතු සියලුම නිලධාරීන් එක් තැනකට කැඳවා මේ සම්බන්ධව පූර්ණ සාකච්ඡාවක් පැවැත්විය යුතු බවට ගරු සභාපතිතුමා මෙහිදී සඳහන් කර සිටින ලදි.

ඉන් අනතුරුව වෙනත් අදහස් ඉදිරිපත් නොවුන අතර මෙතෙක් කාරක සභාවක් බවට පත් කර තිබූ මහ සභාව මෙතැන් සිට නැවත මහ සභාව බවට පත් කළ බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටින ලදි.

ඉන් අනතුරුව

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ නැවත සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

මොණරාගල සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් අපගේ කිසිම විරෝධයක් නොමැති බැවින් මෙම සංවර්ධන සැලැස්ම සකස් කිරීමේ කටයුතු ඉදිරියට සිදු කර ගෙන යාම සඳහා මහා සභාවේ අනුමැතිය ලබා දෙන බව මහා සභාව ඒකමතිකව ප්‍රකාශ කර සිටින ලදි.

**යෝජනා අංක 07**

මොනරාගල නව බස් නැවතුම්පොළ පොදු වැසිකිළිය 2021 වර්ෂයට ටෙන්ඩර් මගින් බඳු කරුවෙකු බඳු නොගත් බැවින් අවසානයේදී දෛනිකව රුපියල් 6000.00 ක් සභාවට ගෙවීමේ පදනම මත මදුරුකැටිය පදිංචි ටී.ඩී. නිර්මලා දමයන්ති යන අය විසින් භාරගෙන කරගෙන ගිය අතර 2022 වර්ෂයේදී මෙම පොදු වැසිකිළිය ටෙන්ඩර් කළද කිසිවෙකු බඳු ගෙන නොමැති බැවින් මෙම වර්ෂයේ ජනවාර් 01 දින සිට ප්‍රා දේශීය සභාවට දෛනිකව රු.5000.00 ක් ගෙවීමේ පදනම මත මෙම පොදු වැසිකිළිය නැවත භාර දෙන ලෙස කර ඇති ඉල්ලීම සඳහා මහා සභාවේ තීරණය හා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදි.

එම යෝජනාව සුදුසු බවට සුනිල් අරංගල ගරු මන්ත්‍රිතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ නැවත සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

ඉහත යෝජනා අංක 05 යටතේ ගත් සභා තීරණය මෙම යෝජනාවට අදාල බැවින් එම සභා තීරණය ක්‍රියාත්මක කිරීම සුදුසු බවට මහ සභාව ඒකමතිකව අනුමත කරන ලදී.

**යෝජනා අංක 08**

මොණරාගල කුමාරදොළපාර වම වරිපනම් අංක 73-42 හා 73-43 යන දේපල ප්‍රාදේශීය සභාවට අයත් ඉඩමක සාදා තිබුණු බැවින් එම ඉඩම සඳහා අධිකරණයේ නඩු පවරන ලද අතර මෙම දේපළ පැවති ඉඩම නැවත ප්‍රාදේශීය සභාවට අධිකරණ තීන්දුවක් මගින් ලබා දුන් අතර එම දේපල සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවේ තක්සේරු කරන ලද මුදල් අදාල ලේඛන වලින් කපා ඉවත් කිරීමට අවශ්‍ය බැවින් ඒ සඳහා මහා සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදි.

එම යෝජනාව සුදුසු බවට තමෝදිරම් ජයශීලන් ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

මෙම දේපල සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව මගින් තක්සේරු කරන ලද මුදල මෙන්ම මේ සඳහා දැනට ලේඛණ වල පවතින හිඟ වරිපනම් මුදල්ද කපා ඉවත් කිරීමට අවශ්‍ය බවත්, තවද අදාල නඩු තීන්දුවට අනුව අප හට භුක්තිය හිමි වූ ඉඩම් කොටස තුළ ඉදි කර තිබූ කඩ කාමර දෙක කඩා ඉවත් කිරීමට අධිකරණ තීන්දුව ලබා දුන් දින සිට අදාල බදු මුදල් ලේඛණ වලින් ඉවත් කිරීමටත් සහා අනුමැතිය ලබා දීම සුදුසු  බවට ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව  සම්බන්ධයෙන් සභාවේ නැවත සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.
මෙම දේපල සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවේ තක්සේරු කරන ලද මුදලත් එයට අදාලව දැනට ලේඛණ වල පවතින වරිපනම් හිඟ මුදලත් , මෙම කඩ කාමර දෙක කඩා ඉවත් කිරීමට අධිකරණ තීන්දුව ලබා දුන් දින සිට ලේඛණ ගත කර ඇති අදාල බදු මුදල ද එම ලේඛන වලින් කපා ඉවත් කිරීමටත් නිර්දේශ කරන අතර ගරු ආණ්ඩුකාරතුමන් වෙත මේ සම්බන්ධයෙන් පැහැදිලි තොරතුරු යොමු කර එතුමන්ගේ අනුමැතිය ලබා ගෙන ඊට අදාලව ඉදිරි කටයුතු කිරීම සුදුසු බවටත් මහ සභාව ඒකමතිකව තීරණය කරන ලදි.

**යෝජනා අංක 09**

බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්වය නගා සිටුවීමේ මූලික වගකීම පැවරී ඇති පළාත් පාලන ආයතනය සිය වගකීම ඉටු කිරීමේ දී පුරවැසියන්ගේ අවශ්‍යතා කෙරෙහි දක්වන සැලකිලිමත් භාවය සහ ප්‍රමුඛතාවය සහතික කරලීම සඳහා ප්‍රාදේශීය සභා කමිටු පිහිටුවීමේ දී පනත් මගින් හඳුන්වා දී ඇති අනිවාර්ය කමිටු 4ට පමණක් සීමා නොවිය යුතු අතර අවශ්‍යතාවය පරිදි හඳුනාගත් තවත් ස්ථාවර කමිටු / කාරක සභා පත්කර ගැනීමට අදාළ පනත් තුළ නෛතිකමය බාධාවන් නොමැති බවත්, පසුගිය කාලය තුළ ශ්‍රී ලංකාවේ ළමා හා කාන්තා හිංසනය පිළිබඳව වැඩි වශයෙන් වාර්තා වී තිබීම සැලකිල්ලට ගෙන ළමා හා කාන්තා අභිවෘද්ධිය උදෙසා 2022 වර්ෂයේ සිට ඔබ බල ප්‍රදේශය තුළ සියලු පළාත් පාලන ආයතන වල ළමා හා කාන්තා කමිටු පිහිටුවීම සඳහා ප්‍රමුඛ අවධානය යොමු කරවන ලෙසට පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය විසින් දැනුම් දී ඇති පරිදි 2022 වසරේ මොනරාගල බලප්‍රදේශය තුළ ළමා හා කාන්තා කමිටු පිහිටුවීම සඳහා අවධානය යොමුකරන ලෙස පළාත් පාලන කොමසාරිස් තුමන් විසින් දැනුම් දී ඇති බැවින් ඒ සඳහා මහා සභාවේ තීරණය හා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදි.

එම යෝජනාව සුදුසු බවට සන්ධ්‍යා අනුරුද්ධිකා ගරු මන්ත්‍රීතුමිය විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ නැවත සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය විසින් දැනුම් දී ඇති පරිදි 2022 වර්ෂයේ මොනරාගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල ළමා හා කාන්තා කමිටු පිහිටුවීම සඳහා අවධානය යොමු කිරීම වැදගත් කටයුත්තක් බැවින් පළාත් පාලන කොමසාරිස් තුමන් විසින් දැනුම් දී ඇති පරිදි බල ප්‍රදේශය තුල ළමා හා කාන්තා කමිටු පිහිටුවීම සුදුසු බවත්, ඒ සඳහා මූලිකත්වය ගෙන කටයුතු කිරීම සඳහා සභාවේ සාකච්ඡා කර ගත් පරිදි පහත සඳහන් මන්ත්‍රීවරියන් හට බලය පවරා දීම සුදුසු බවත්, ඒ වගේම මේ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සඳහා අවශ්‍ය උපදෙස් හා මගපෙන්වීම් සහකාර පළාත් පාලන කොමසාරිස් කාර්යාලය මගින් ලබා ගනිමින් කටයුතු කරන ලෙසත් මේ සඳහා ප්‍රාදේශීය සභාව මගින් අවශ්‍ය උපරිම සහයෝගය නිරතුරුවම ලබා දෙන ලබාදෙන බවත් මහ සභාව ඒකමතිකව අනුමත කරන ලදි.

**<u>මොනරාගල බල ප්‍රදේශය තුළ ළමා හා කාන්තා කමිටු පිහිටු වීම සඳහා මූලිකත්වය ගෙන කටයුතු කිරීමේ වගකීම පැවරීම - මොනරාගල ප්‍රාදේශීය සභාව</u>**

| | | |
|---|---|---|
| **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී** | **-** | **සන්ධ්‍යා අනුරුද්ධිකා රත්නායක මැතිතුමිය** |
| **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී** | **-** | **ආර්.එම්.උදේනි රම්‍යලතා මැතිතුමිය** |
| **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී** | **-** | **කේ.මනෝජා ලක්මිණී මැතිතුමිය** |

**යෝජනා අංක 10**

මොණරාගල තෙනගල්ලන්ද හි පදිංචි එච්.කේ නිශාන්ත ගුණවර්ධන යන අය විසින් ලබාගෙන ඇති මොණරාගල නව තොගපොළ භූමියේ ඇති අංක 13 දරන තොග කඩේ හි මුහුණත ආවරණය වී පවතින බැවින් කිසිදු වෙළඳාම කටයුත්තක් නිසි පරිදි කර ගැනීමට නොහැකි වී තිබීම නිසා ප්‍රමාණවත් ආදායමක් ද නොලැබෙන බැවින් කඩ කුලී පවා ගෙවා ගැනීමට අසීරු තත්ත්වයකට මුහුණ පා ඇති බැවින් එහි මුහුණත මාර්ගයට විවෘත වන පරිදි සකස් කර දෙන ලෙස බදු කරු විසින් කර ඇති ඉල්ලීම සඳහා සභා තීරණය හා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදි.

එම යෝජනාව සුදුසු බවට ප්‍රදීප් විජේරත්න ගරු උප සභාපතිතුමන් විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

මේ ආකාරයෙන් මෙම කඩ කාමර වලට අවහිරයක් වී පැවතීම නිසා මෙම බදු කරුවන් විසින් කුලී ගෙවීම් ද ප්‍රමාද කර ඇති බව ගරු සභාපතිතුමන් විසින් සඳහන් කර සිටින ලදි.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ නැවත සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

කාර්මික නිලධාරී මහතාගේ නිර්දේශ සහ අධීක්ෂණය යටතේ මෙම කඩ කාමර වල වෙනසක් සිදු කිරීමේ දී කොන්දේසි පැනවිය යුතු බැවින් අදාළ කොන්දේසි සහිතව මෙහි පොල පැත්තට තිබෙන ප්‍රධාන දොරටුව ඒ ආකාරයෙන්ම තිබියදී මෙම අවහිරතාවය මඟ හරවා ගැනීමට ඉදිරිපසින් දොරක් හෝ යොදා යම් වෙනසක් සිදු කර විධිමත් ක්‍රමවේදයන්ට යටත්ව සභා අරමුදලින් සකස්කර දීම සුදුසු බවට මහ සභා ඒකමතිකව අනුමත කරන ලදි.

### යෝජනා අංක 11

මොණරාගල රන්ගිරිපුර ග්‍රාමයේ පදිංචි කරුවන් 23 දෙනෙකුගේ එකතුවෙන් ගොඩ නගන ලද රංගිරි සුභසාධක හා අවමංගල්‍යාධාර සමිතියේ සාමාජිකයින් කිහිපදෙනෙකුගේ නිවෙස්වලට ප්‍රවේශ වන මාර්ගයක් වන රංගිරිපුර ප්‍රධාන කාපට් මාර්ගයට සම්බන්ධ වෙන මීටර් 300 ක පමණ දිගින් යුත් අතුරු මාර්ගය වර්ෂාව හේතුවෙන් මඩ වළවල් හා වතුර කාණු සැකසී ගමන් කිරීමට නොහැකි වන පරිදි අබලන් තත්ත්වයට පත්ව ඇති අතර එම පොදු මාර්ගය ප්‍රාදේශීසභාව මගින් සුදුසු පරිදි අලුත්වැඩියා කර නිසි පරිදි භාවිතා කිරීමට හැකිවන පරිදි සකස් කර දීම සඳහා සමිතියේ නිලධාරීන් විසින් කර ඇති ඉල්ලීම සලකා බලා එය සංවර්ධනය කර දීම සඳහා මහා සභාවේ තීරණය හා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදි.

එම යෝජනාව සුදුසු බවට තමෝදිරම් ජයජීලන් ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ නැවත සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

කාර්මික නිලධාරී මහතාගේ නිර්දේශ සහ අධීක්ෂණය යටතේ මෙම ප්‍රධාන මාර්ගයට සම්බන්ධ වන මීටර් 300 ක පමණ දිගින් යුත් අතුරු මාර්ගය ග්‍රැවල් යොදා විධිමත් ක්‍රමවේදයන්ට යටත්ව සභා අරමුදලින් සකස්කර දීම සුදුසු බවට මහ සභා ඒකමතිකව අනුමත කරන ලදි.

### යෝජනා අංක 12

ප්‍රාදේශීය සභාවට අයත් කුඹුක්කන පුස්තකාලය අසල ඇති ප්‍රජා ශාලාව පුස්තකාලයේ කටයුතු සඳහා ඉතාමත් වැදගත් ව පවතින අතර රටේ පවතින වසංගත තත්වය හමුවේ දුරස්ථ භාවය රැකගෙන දරුවන් සමඟ විවිධ වැඩසටහන් සඳහා භාවිතයට ගත හැකි බැවින් එය නවීකරණය කර ඒ අවට මිදුල ළමයින්ට හිතැති පරිසරයක් බවට සකස් කර දීම සඳහාත් ඒ වගේම මෙම පුස්තකාලයේ කටයුතු සාර්ථකව කරගෙන යාම සඳහා පරිගණකයක් සහ ප්‍රින්ටර් යන්ත්‍රයක් ලබා දීම සඳහාත් මහා සභාවේ තීරණය හා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදි.

එම යෝජනාව සුදුසු බවට සුනිල් අරංගල ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ නැවත සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

කුඹුක්කන ප්‍රාදේශීය සභා පුස්තකාලයේ රාජකාරි කටයුතු විධිමත්ව සිදු කරගෙන යාම වෙනුවෙන් අවශ්‍ය වන පරිගණකයක් සහ ප්‍රින්ටරයක් ඇතුළුව ඒ සඳහා අවශ්‍ය වන සියලුම උපාංගද මේ සමඟම අන්තර්ජාල පහසුකම්ද නිරතුරුම අවශ්‍ය වන බැවින් ඒ සඳහා අවශ්‍ය වන රවුටර් පහසුකම්ද ලබා දීම සුදුසු බවත්, ඒ වගේම කාර්මික නිලධාරි මහතෙකු යොදවා මෙම ස්ථානය අධීක්ෂණය කර මෙම පෙර පාසලට පැමිණෙන දූවා දරුවන්ගේ විවිධ ප්‍රායෝගික වැඩ සටහන් සඳහා අසල ප්‍රජාශාලාව භාවිතයට ගැනීමේ පහසුකමක් පවතින්නේනම් පුස්තකාලයේ වැඩ සටහන් වෙනුවෙන් අවශ්‍ය පරිදි තීන්ත ආලේප කර පවතින අත්‍යාවශ්‍ය අඩුපාඩු පමණක් සකස් කර අවට මිදුල ද සුදුසු පරිසරයක් ලෙස සකස් කර දීම ආදී කටයුතු විධිමත් ක්‍රමවේදයන්ට යටත්ව සභා අරමුදලින් සිදු කර දීම සුදුසු බවට මහ සභාව ඒකමතිකව අනුමත කරන ලදි.

**යෝජනා අංක 13**

හුලන්දාව පොදු වැසිකිළිය නැවත ප්‍රතිසංස්කරණය කිරීම සඳහා මහා සභාවේ තීරණය හා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදි.

එම යෝජනාව සුදුසු බවට වයි.උපුල් ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

මෙම වැසිකිළියේ මේ වන විට කම්බි දිරා අබලන් තත්වයේ පවතින නමුත් පවතින අලුත්වැඩියා කටයුතු කිහිපය සිදුකර තව අවුරුදු කිහිපයකටම භාවිතයට ගත හැකි පරිදි සකස් කරගත හැකි බව ගරු සභාපතිතුමා සඳහන් කර සිටින ලදි.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ නැවත සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

කාර්මික නිලධාරි මහතෙකු යොදවා පරීක්ෂාකර බලා මෙම වැසිකිලියේ මේ වන විට අබලන් තත්වයේ පවතින අලුත්වැඩියා කටයුතු කිහිපය සහා අරමුදලින් සිදුකර භාවිතයට ගත හැකි පරිදි සකස් කර ඉදිරියට එය නඩත්තු කරමින් පවත්වාගෙන යාමට කටයුතු කිරීම සුදුසු බවට මහ සභාව ඒකමතිකව අනුමත කරන ලදි.

**යෝජනා අංක 14**

ප්‍රාදේශීය සභා ස්ථාවර කමිටු 4 හතර 2022 වර්ෂයට නැවත පත්කර පත් කර එමගින් තීන්දු තීරණ ගැනීමට සභාවේ බලය පවරා දීම සඳහා මහ සභා අනුමැතිය ලබාදීම සඳහා මහා සභාවේ තීරණය හා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදි.

එම යෝජනාව සුදුසු බවට තමෝදිරම් ජයශීලන් ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ නැවත සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

මෙම කමිටු සඳහා නව සාමාජිකයින් නැවත පත් කිරීම අත්‍යවශ්‍ය නොවන බැවින් පෙර වර්ෂ වල තොරා පත් කර ගෙන පවත්වාගෙන ගිය ප්‍රාදේශීය සභා ස්ථාවර කමිටු 4 හතර (මුදල් හා ප්‍රතිපත්ති සැකසීම් කමිටුව, තාක්ෂණික සේවා කමිටුව , නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුව , පරිසර හා පහසුකම් කමිටුව ) සඳහා වෙන වෙනම පත් කර ඇති සාමාජිකයන්ම සහිතව 2022 වර්ෂයට ද එම කමිටු හතර ඒ ආකාරයෙන්ම පවත්වාගෙන යාම සුදුසු බවත්, එම කමිටු හරහා තීන්දු තීරණ ගැනීමට මහ සභාවේ බලය පැවරීම සුදුසු බවටත් මහ සභාව ඒකමතිකව අනුමත කරන ලදි.

**යෝජනා අංක 15**

මොණරාගල නව බස් නැවතුම්පොලේ ජනතාවට රැදී සිටීමට අවශ්‍ය බංකු තැබීමේදී අවහිරවන ඉදිරිපස තාප්පයේ කොටසක් කඩා ඉවත් කර සුදුසු ආකාරයට සකස් කිරීම සඳහා මහා සභාවේ තීරණය හා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදි.

එම යෝජනාව සුදුසු බවට චාමර නානායක්කාර ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඒ වගේම මෙම නව බස් නැවතුම්පළ ගොඩනැගිල්ල සහ පොදු සුසාන භූමියේ ආදාහනාගාරය විවෘත කිරීමේ කටයුතු සඳහා අවශ්‍ය දැන්වීම් පුවරු සහ පළක සකස් කර සවි කිරීමට කටයුතු කළ යුතු බවත් , ඒ වගේම බස් රථ නැවතුම් ස්ථාන සඳහා අවශ්‍ය දැන්වීම් පුවරු සකස් කිරීමත් අවශ්‍ය බැවින් ඒ සඳහාත් ඒ වගේම මෙම බස් නැවතුම්පොලේ අවශ්‍ය බංකු කිහිපයක් සවිකිරීම සඳහාත්, ඉදිරිපස පෙව්මන්ට් වල අඩු පාඩු සකස් කර බස් රථ වලට පහසුවෙන් මගීන්ට ඇතුළු වීමට හැකි වන අයුරින් පිවිසුම් ස්ථාන සකස් කර ගොඩනැගිල්ලේ තීන්ත ආලේප කිරීම ආදී කටයුතු ද සිදු කිරීමට අවශ්‍ය බව ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ නැවත සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

කාර්මික නිලධාරී මගින් පරීක්ෂා කර බලා මෙම නව බස් නැවතුම්පලේ බංකු තැබීමේදී අවහිරවන ඉදිරිපස තාප්පය කොටසක් අවශ්‍යතාවයට සරිලන ආකාරයට විධිමත් පරිදි කඩා ඉවත් කර නිසි පරිදි සකස් කිරීමත්, අවශ්‍ය බංකු කිහිපයක් සවිකිරීමත්, සුදුසු බවටත්, ඒ වගේම පෙව්මන්ට් වල පවතින අඩු පාඩු සකස් කර බස් රථ වලට පහසුවෙන් මගීන්ට ඇතුළු වීමට හැකි වන අයුරින් පිවිසුම් ස්ථාන සකස් කර ගොඩනැගිල්ලේ තීන්ත ආලේප කිරීම ආදී කටයුතු ද ඒ වගේම මෙම සියලු ඉදිකිරීම් සඳහා අවශ්‍ය වන දැන්වීම් පුවරු සහ පළක සකස් කර සවි කිරීමත් ඊට අදාල සියලු ගෙවීම් විධිමත් ක්‍රමවේදයන්ට යටත්ව සභා අරමුදලින් ගෙවීම් කිරීම සුදුසු බවටත් මහ සභාව ඒකමතිකව අනුමත කරන ලදි.

**යෝජනා අංක 16**

මොනරාගල වෙහෙරගල පුරාණ විහාරස්ථානයට ජලය ලබා ගැනීමේදී බලවත් දුෂ්කරතාවයන්ට පත්ව ඇති අතර දහම් පාසලේ දරුවන් 350 කට පමණ හා වෙනත් විශේෂ දිනයන් වලට විහාරස්ථානයට පැමිණෙන පින්වතුන් සඳහා පානීය ජලය ලබා ගැනීමේදී දැනට මීටර් 600ක් පමණ දුර දායක මහත්මයෙකුගේ නිවසෙහි පුද්ගලික ළිඳකින් වතුර ලබා ගන්නා අතර එම දුර ප්‍රමාණය වැඩි නිසා නොයෙකුත් අපහසුතාවලට ලක් ව ඇති බැවින් එම විහාරස්ථාන භූමියේ ඉදි කරන ලද පැරණි නළ ළිඳ ප්‍රතිසංස්කරණය කර දෙන ලෙස විහාරාධිපති විසින් කර ඇති ඉල්ලීම සඳහා මහා සභාවේ තීරණය හා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදි.

එම යෝජනාව සුදුසු බවට කේ.එම්.ගුණවර්ධන ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ නැවත සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

කාර්මික නිලධාරි මහතෙකු යොදවා පරීක්ෂාකර බලා මෙම විහාරස්ථානයේ පවතින පැරණි නළ ළිඳ සහා අරමුදල් වියදම් කර භාවිතයට ගත හැකි අයුරින් පවතින අඩු පාඩු සකස් කර ප්‍රතිසංස්කරණය කර දීම සුදුසු බවට මහ සභාව ඒකමතිකව අනුමත කරන ලදි.

**යෝජනා අංක 17**

හොරොම්බුව ජයසෙන්ගම පැරණි සුසාන භූමියේ දැනට ළමා උද්‍යානයක් සකස් කිරීම සඳහා සංවර්ධනය කර ඇති භූමියට අයත් ඉඩමේ පහත සඳහන් ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම සඳහා සභා අනුමැති ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහා සභාව වෙත යෝජනා කර සිටින ලදි.

I. පැරණි දිරාගිය කසල යොදා පුරවා ඇති ඉඩම් කොටස තවදුරටත් පස් යොදා ආවරණය කර ගල් රෝලක් යොදා තැලීමට භාජනය කිරීම.
II. ඉඩමේ ප්‍රධාන මාර්ගයට ඇති මායිම හා අතුරු මාර්ගය දෙපස ඇති මායිම දැල් වැටක් යොදා ආවරණය කිරීම.
III. මතුපිට පස් පිරවීමෙන් පසු පාංශු ඛාදනය වැලැක්වීමට පැති බැම් ඇති ස්ථානවලට හා අත්‍යාවශ්‍ය ස්ථානවලට තණකොළ පිඩලි ඇල්ලීම.
IV. ඉඩම මැදින් ගලා බසින වැසි ජල ආරෙන් ගලා එන ජලය විධිමත් පරිදි බැස ගෙන යාම සඳහා කුඩා ඩෝසර් යන්ත්‍රයක් යොදා සකස් කිරීම.
V. ඉඩමේ බටහිර කොටස තුළ ළමා උද්‍යානයක් සකස් කිරීම හා සෙල්ලම් උපකරණ සවි කිරීම.
VI. සුදුසු ස්ථානයක ප්‍රදේශයේ තරුණ තරුණියන්ට ක්‍රීඩා කිරීමට බැඩ්මින්ටන් ක්‍රීඩාගාරයක් සකස් කිරීම.

එම යෝජනාව සුදුසු බවට සුනිල් අරංගල ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ නැවත සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

ඒ වගේම මෙම සුසාන භූමිය තුළ පවතින මිනී වළවල් ටික හාරා ඒවායෙහි ඇති මළ සිරුරු වල ඉතිරි කොටස් නැවත එම භූමියට ආසන්න නව සුසාන භූමියේ මායිමට වන්නට වළවල් කපා තැන්පත් කර ඒ එක් එක් වළවල් සඳහා කුළුණු ටිකක් සකස් කරමු බවත්, මේ සඳහා අයිතිකරුවන් විසි දෙනෙකු පමණ සිටින බැවින් මේ වන විටත් ඔවුන් ඒ සඳහා කැමැත්ත ප්‍රකාශ කර ඇති බැවින් එක් දිනයකදී මේ සියලු දෙනාම උසාවියට ගෙන්වා අධිකරණ තීන්දුවක් මගින් මෙම සොහොන් ඉවත් කර ගැනීමට කටයුතු කරන බවට ගරු සභාපතිතුමා සඳහන් කර සිටින ලදි.

මෙම යෝජනාවට අදාල සියලු කටයුතු විධිමත් ක්‍රමවේදයන්ට යටත්ව සහා අරමුදල් ප්‍රමාණවත්ව පවතින අවස්ථාවන්වලදී සිදු කිරීම සුදුසු බවත්, ඒ වගේම මෙම සුසාන භූමිය තුළ ඉවත් කරන මළ සිරුරු කොටස් විධිමත්ව ඉවත් කර නැවත තැන්පත් කිරීමද විධිමත් ක්‍රමවේදයන්ට යටත්ව සිදු කිරීම සුදුසු බවටත් මහ සභාව ඒකමතිකව අනුමත කරන ලදි.

**යෝජනා අංක 18**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ (5)(1)184 වගන්තිය හා 1988 ප්‍රාදේශීය සභා මූල්‍ය හා පරිපාලන රීති අංක 05 (8) යටතේ රීති අංක (1)2ප්‍රකාරව මා හට ලැබී ඇති බලතල අනුව මෙම ප්‍රාදේශීය සභාවේ 2021.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ගබඩා භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයේ පහත සඳහන් පරිදි සභාපති ඇතුළු සෙසු සාමාජික මහත්ම මහත්මීන් යොදවා ගනිමින් ප්‍රාදේශීය සභාවට අයත් සියලුම අංශ / ආයතන වල භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදු කිරීම සඳහා මහා සභාවේ තීරණය හා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදි.

| අනු අංක | නම | තනතුර | සමීක්ෂණ මණ්ඩලයේ තනතුර | කාර්යාලය | දුරකථන අංකය |
|---|---|---|---|---|---|
| 01 | ඩබ්.එන්.පී.චන්ද්‍රපාල මිය | ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරී | සභාපති | ප්‍රාදේශීය සභාව, මොනරාගල. | 071-4970365 |
| 02 | ඒ.ඩී.සුනිල් අරංගල මයා | ප්‍රාදේශීය සභා සභික | සාමාජික | ප්‍රාදේශීය සභාව, මොනරාගල | 077-9791277 |
| 03 | ඒ.එම්.සුගතදාස මයා | කළමනාකරණ සේවා නිලධාරී | සාමාජික | ස.ප.පා.කො. කාර්යාලය මොනරාගල | |
| 04 | ඩබ්.එම්.සරත් කුමාර වනසිංහ මයා | කාර්මික නිලධාරී | සාමාජික | ප්‍රාදේශීය සභාව, මොනරාගල | 071-4469236 |
| 05 | කේ.එම්.එන්.ප්‍රියදර්ශණී මිය | සංවර්ධන නිලධාරී | සාමාජික | ප්‍රාදේශීය සභාව, මඩුල්ල. | 071-5427663 |
| 06 | කේ.ජී.සෝමාවතී මිය | සංවර්ධන නිලධාරී | සාමාජික | ප්‍රාදේශීය සභාව, මඩුල්ල. | 071-7755717 |
| 07 | කේ.එම්.ලොකුබණ්ඩා මයා | සංවර්ධන නිලධාරී | සාමාජික | ප්‍රාදේශීය සභාව, මොනරාගල | 078-3464755 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 08 | කේ.එම්.එන්.සී.දමයන්ති මිය | සංවර්ධන නිලධාරි | සාමාජික | ප්‍රාදේශීය සභාව, මොනරාගල | 071-2692230 |
| 09 | ඩී.එම්.දුලිකා සාමලී මිය | සංවර්ධන නිලධාරි | සාමාජික | ප්‍රාදේශීය සභාව, මොනරාගල | 071-4084341 |
| 10 | ඊ.ඩබ්.ඊ.ආර්.දමයන්ති මිය | සංවර්ධන නිලධාරි | සාමාජික | ප්‍රාදේශීය සභාව, මොනරාගල | 071-7905962 |
| 11 | කේ.වයි.ඒ.දනිල් ශාන්ත මයා | කළමනාකරණ සේවා නිලධාරි | සාමාජික | ප්‍රාදේශීය සභාව, මොනරාගල | 071-7347225 |
| 12 | කේ.එම්.ප්‍රභාත් චින්තක මයා | කළමනාකරණ සේවා නිලධාරි | සාමාජික | ප්‍රාදේශීය සභාව, මොනරාගල | 071-7016420 |
| 13 | ඩී.එම්.ප්‍රසාදි චතුරිකා මිය | සංවර්ධන නිලධාරී | සාමාජික | ප්‍රාදේශීය සභාව, මොනරාගල | 071-1281809 |
| 14 | ඩී.එම්.චන්ද්‍රිකා සුදර්ශනී මිය | සංවර්ධන නිලධාරී | සාමාජික | ප්‍රාදේශීය සභාව, මොනරාගල | 071-8460056 |

භාණ්ඩ සමීක්ෂණය සිදුකළ යුතු අංශ/ ආයතන පිළිබඳ තොරතුරු පහත සඳහන් කරමි.

01. පැරණි ප්‍රාදේශීය සභා කාර්යාලය හා නව ප්‍රාදේශීය සභා කාර්යාලය,
02. මොනරාගල මහජන පුස්තකාලය
03. වැලියාය මහජන පුස්තකාලය,
04. කොම්පොස්ට් ව්‍යාපෘතිය,
05. මොනරාගල ප්‍රජාශාලාව,
06. ප්‍රාදේශීය සභා පෙර පාසල,
07. මොනරාගල සතිපොළ හා තොග පොළ
08. මොනරාගල ප්‍රාදේශීය සභාවට අයත් ක්‍රීඩා පිටි,
09. මොනරාගල ප්‍රාදේශීය සභා පොදු සුසාන භූමිය
10. මොනරාගල ප්‍රාදේශීය සභාවට අයත් පොදු මාර්ග
11. ප්‍රාදේශීය සභාවට අයත් ඉඩම්
12. ප්‍රාදේශීය සභාවට අයත් වාහන
13. ප්‍රාදේශීය සභාව සතු ගොඩනැගිලි
14. කුඹුක්කන මහජන පුස්තකාලය
15. කුඹුක්කන සංචාරක මධ්‍යස්ථානය
16. නව කච්චේරිය අසල පිහිටි ක්‍රීඩා උද්‍යානය

එම යෝජනාව සුදුසු බවට රංජිත් රත්නායක ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ නැවත සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

2021.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආයතනයේ භාණ්ඩ සමීක්ෂණ කටයුතු සඳහා සාමාජික මහත්ම මහත්මීන් ලෙස තෝරා පත් කර ගෙන ඇති මෙම නිලධාරීන් දාහතර දෙනා යොදවාගෙන භාණ්ඩ සමීක්ෂණය සිදු කළ යුතු අංශ සහ ආයතන පිළිබඳව ඉදිරිපත් කර ඇති තොරතුරු වලට අදාලව ඉතාමත්ම සාර්ථක නිවරදි භාණ්ඩ සමීක්ෂණයක් සිදු කර අවසන් කිරීම සුදුසු බවට මහ සභාව ඒකමතිකව අනුමත කරන ලදි.

**යෝජනා අංක 19**

මොනරාගල ප්‍රාදේශීය සභා කාර්යාලය තුල සහ ප්‍රාදේශීය සභා පෙර පාසල් භූමිය තුළ ජාතික උරුමයන් සහ ස්වභාවික සෞන්දර්යය පිළිබිඹු කරන දැනුවත් කිරීමේ පුවරු සහ ස්ටිකර් සකස් කර සවි කිරීම සඳහා මහා සභා අනුමැතිය ලබාදීම සුදුසු බවටත් , ඒ වගේම කසළ කළමනාකරණය හා කාබනික පොහොර නිෂ්පාදන පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සඳහා අඩි 2x2, අඩි 4x2, අඩි 6x3 ප්‍රමාණ වලින් යුත් දැන්වීම් පුවරු සකස් කර නාගරික බල ප්‍රදේශයේ සවි කිරීම අවශ්‍ය බැවින් ඒ සඳහා ද සභා අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදි.

ඒ වගේම මොනරාගල ප්‍රාදේශීය සභා පෙර පාසල සඳහා 2022.01.27 දින 2022 වර්ෂය සඳහා නවක ළමුන් ඇතුලත් කර ගැනීමට අවශ්‍ය බැවින් ඊට ප්‍රථම එහි ප්‍රධාන ගොඩනැගිල්ලේ බිම සඳහා ටයිල් අතුරා සකස් කරගැනීමට අවශ්‍ය ව ඇතත් ඒ සඳහා විශාල වියදමක් දැරීමට සිදුවන බැවින් ඊට වඩා අඩු වියදමකින් ටෙරාසෝ හෝ ටයිටේනියම් ඇතිරීමක් සිදු කර  මෙම ශාලාවේ ඇතුලත සහ පිටත පේව්මන්ට් ආදිය සකස් කර ගැනීම සඳහා මහා සභාවේ අනුමැතිය ද මේ සමඟම ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා මෙහි දී නැවත ප්‍රකාශ කර සිටින ලදි.

මෙම යෝජනාව සුදුසු බවට ක්‍රිෂාන්ත රත්නායක ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව  සම්බන්ධයෙන් සභාවේ නැවත සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

සභා කාර්යාලය තුල සහ ප්‍රාදේශීය සභා පෙර පාසල් භූමිය තුළ ජාතික උරුමයන් සහ ස්වභාවික සෞන්දර්යය පිළිබිඹු කරන දැනුවත් කිරීමේ පුවරු හා ඉස්ටිකර් සකස් කර සවි කිරීමත්, මෙම පෙර පාසලේ ප්‍රධාන ගොඩනැගිල්ලේ බිම සඳහා සුදුසු වන පරිදි ටෙරාසෝ හෝ ටයිටේනියම් ඇතිරීමක් සිදු කර  මෙම ශාලාවේ ඇතුලත සහ පිටත පේව්මන්ට් ආදිය සකස් කිරීම සුදුසු බවටත්,  ඒ වගේම කසළ කළමනාකරණය හා කාබනික පොහොර නිෂ්පාදනය පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සඳහා අඩි 2x2 ,අඩි 4x2, අඩි 6x3 යන ප්‍රමාණ වලින් යුත් දැන්වීම් පුවරු සකස් කර නාගරික බල ප්‍රදේශය තුළ සවි කිරීම සුදුසු බවටත් මහ සභාව ඒකමතිකව අනුමත කරන ලදි. ඒ වගේම මෙම කටයුතු සඳහා සභා අරමුදලින් වියදම් දැරීමේදී නියමිත අධීක්ෂණ කටයුතු, ඇස්තමේන්තු, පසු විපරම් වාර්තා, ආදී සියලු කටයුතු විධිමත් ක්‍රමවේදයන්ට යටත්ව සිදු කර විනිවිදභාවයකින් යුක්තව සිදු කිරීම සුදුසු බවට මහ සභාව තීරණය කරන ලදි.

**යෝජනා අංක 20**

සභාව සතු කොම්පෝස්ට් ව්‍යාපෘතියේ 2022 වර්ෂය සඳහා ප්‍රතිචක්‍රීයකරණය කළ හැකි කසල ගබඩා කිරීමට සකස් කර ඇති ගොඩනැගිල්ල අසල කසළ තේරීම පහසු කිරීම සඳහා ශාලාවක් සභා අරමුදලින් ඉදිකිරීම, කොම්පෝස්ට් අංගනයේ කොන්ක්‍රීට් ආස්තර යෙදීම, ගලි වලවල් හා කාණු පද්ධතිය සකස් කිරීම ,පොහොර ගබඩාවට පිවිසීම සඳහා කොන්කීට් ආස්තරයක් යෙදීම සඳහා සභා අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදි.

එම යෝජනාව සුදුසු බවට තමෝදිරම් ජයසීලන් ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව  සම්බන්ධයෙන් සභාවේ නැවත සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

සභාව සතු මෙම කොම්පෝස්ට් ව්‍යාපෘතියේ ඉදිරිපත් තර ඇති මෙම සංවර්ධන කටයුතු සභා අරමුදලේ ප්‍රමාණවත් මුදල් පවතින අවස්ථාවන් වලදී විධිමත් ක්‍රමවේදයන්ට යටත් සිදු කිරීම සුදුසු බවට මහ සභාව ඒකමතිකව අනුමත කරන ලදි.

**යෝජනා අංක 21**

මොණරාගල රෙස්ට්හවුස් හන්දියේ සිට වැදිකුඹුර මාර්ගයේ කිලෝ කිලෝමීටර් 1.4 ගිය විට හමුවන හරිත මාවතෙහි පවුල් 6 ක් පමණ පදිංචි අතර කුඹුරු යායට ගමන් කරන මාර්ගය ද මේ ඔස්සේ පවතින බැවින් වැසි කාලයට ගමනා ගමනය ඉතා අසීරු තත්ත්වයකට පත්ව ඇති බැවින් මෙම මාර්ගය කොන්ක්‍රීට් යොදා සකස් කර දීම සඳහා සභා අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදි.

එම යෝජනාව සුදුසු බවට තමෝදිරම් ජයසීලන් ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව  සම්බන්ධයෙන් සභාවේ නැවත සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

කාර්මික නිලධාරී නිර්දේශ සහිතව සභාවට ලැබීමට නියමිත ප්‍රතිපාදන වලින් ඉදිරියේදි මෙම මාර්ගය ද කොන්ක්‍රීට් යොදා සකස් කර දීම සුදුසු බවට මහ සභාව ඒකමතිකව තීරණය කරන ලදි.

**යෝජනා අංක 22**

මොනරාගල ප්‍රාදේශීය සභාවට අයත් පහත සඳහන් වාහන හා යන්ත්‍රෝපකරණ අළුත්වැඩියා කිරීම, සේවා කටයුතු සිදු කිරීම, අමතර කොටස් ලබා ගැනීම වෙනුවෙන් අදාළ කටයුතු කිරීමටත්, ඒ සඳහා වැය වූ මුදල් සභා අරමුදලෙන් වියදම් දැරීමටත් මහ සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදී.

| අනු අංකය | විස්තරය | මුදල රු. |
|---|---|---|
| 01 | PF – 7419 කැබ් රථයේ ෂීට් කවර මැසීම | 27500.00 |
| 02 | 252-6330 කැබ් රථයේ කාපට් සෙට් 01 දැමීම | 1750.00 |
| 03 | RS – 1800 මෝටර් ග්‍රේඩරයේ ෂියර් පින් 02ක් හා ග්‍රයිඩ් රේල් 03 දැම්ම | 76248.00 |
| 04 | RS – 1800 මෝටර් ග්‍රේඩරයේ වාරසේවා සිදු කිරීම | 37110.79 |
| 05 | ZA – 5061 බැකෝලෝඩරය ඔයිල් සීල් කට්ටල 01 | 10158.75 |
| 06 | ZA – 5061 බැකෝලෝඩරයේ ජැක් කවර හා ජැක් අළුතින් දැමීම | 90812.83 |
| 07 | ZA – 5061 බැකෝලෝඩරයේ බූම් සිලින්ඩර් වීල් කිට් එක හා රියර් ට්‍රාන්ස්මිෂන් වීල් කිට් එක දැමීම | 35716.85 |
| 08 | ZA – 5061 බැකෝලෝඩරෙයේ ට්‍රාන්ස් මිසන් පද්ධතියේ ඔයිල් සීල් දැමීම. | 41115.71 |
| 09 | ZA – 5061 බැකෝලෝඩරයේ පැච් දැමීම වෙනුවෙන් මුදල් ගෙවීම | 3200.00 |
| 10 | ZA – 5061 බැකෝලෝඩරයේ ස්වීමින් ජැක් එකෙහි බැරල් එක පාස්සා ජැක් වීල් කිට් දැමීම. | 18500.00 |
| 11 | ZA – 5061 බැකෝලෝඩරයේ ටයර් රෝඩ් රැක් එක පුරවා පොට කැපීම | 4500.00 |
| 12 | ZA – 5061 බැකෝලෝඩරයේ ½ 2R හෝස් එක දැමීම | 4800.00 |
| 13 | ZA – 5061 බැකෝලෝඩරයේ ඕල්ටනේටර් හෝස් එක දැමීම | 3200.00 |
| 14 | ZA – 5061 බැකෝලෝඩරයේ 3/5 2 R හෝස් එක දැමීම7 | 3800.00 |
| 15 | ZA – 5061 බැකෝලෝඩරයේ 5/8 හෝස් 2ක් දැමීම | 11800.00 |
| 16 | LL -7682 කaa කැබ් රථයේ 650x 10 ටයර් 01 වෙප් 01 | 21800.00 |
| 17 | LL -7682 කaa කැබ් රථයේ ස්ටාර්ට් මෝටරය අලුතින් දැමීම | 27500.00 |

එම යෝජනාව සුදුසු බවට කේ.එම්.ගුණවර්ධන ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

විධිමත් ක්‍රම වේදයන්ට යටත්ව හා අදාල පරීක්ෂණ වාර්තා , නිර්දේශ කිරීම් හා අදාල අනුමැතීන්ට යටත්ව මෙම අලුත්වැඩියා කටයුතු සිදු කර මෙම ගෙවීම් කටයුතු සිදුකිරීමටත් ඒ සඳහා සභා අරමුදලින් ගෙවීම් කිරිම සුදුසු බවටත් සභාව ඒකමතිකව අනුමත කරන ලදී.

**යෝජනා අංක 23**

2022 වර්ෂයේ ජනවාරි මාසයට ආයතනය සඳහා මිලදී ගනු ලැබූ පහත සඳහන් අත්‍යවශ ද්‍රව්‍ය ලබාදීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහා සභාව වෙත යෝජනා කර සිටින ලදී.

- සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම සඳහා පත්තර දැන්වීම් සඳහා ගෙවීම රු. 88,128.00
- කම්කරුවන් සඳහා වැහි වැහිකබා ලබා ගැනීම රු. 67,000.00
- ආයතනයට අත්‍යාවශ්‍ය උපකරණ හා
  ලිපිඅවශ්‍ය උපකරණ හා ලිපි ද්‍රව්‍ය මිලදී ගැනීම රු. 244,346.00
- ආදාහනාගාරයට අවශ්‍ය ගෑස් සිලින්ඩර නැවත පිරවීම සඳහා රු. 301,826.89
- මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් සඳහා අවශ්‍ය උපකරණ මිලදී ගැනීම රු. 28,538.00
- ආයතනයට අත්‍යාවශ්‍ය උපකරණ හා ලිපි ද්‍රව්‍ය මිලදී ගැනීම රු. 117,960.00
  රු. 72,675.00
- ආයතනයට අත්‍යවශ්‍ය ලිපිලේඛන මුද්‍රණය කර ගැනීම රු. 66,800.00
- ආයතනයට අත්‍යවශ්‍ය උපකරණ මිලදී ගැනීම රු. 167,785.00
- ආයතනයේ පරිගණක අලුත්වැඩියා කිරීම සඳහා ගෙවීම රු. 19,600.00

එම යෝජනාව සුදුසු බවට චාමර නානායක්කාර ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

ආයතනයට අත්‍යාවශ්‍ය මෙම මිලදී ගැනීම්, අදාල උපකරණ හා භාණ්ඩ විධිමත් ක්‍රමවේදයන්ට යටත්ව මිලදී ගෙන ඒ සඳහා සභා අරමුදලින් ගෙවීම් කටයුතු කිරීම සුදුසු බවටත් ගරු සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

## 05.2 ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ක්‍රිශාන්ත රත්නායක මහතා විසින් සභාවට ඉදිරිපත් කරනු ලබන යෝජනා

**යෝජනා අංක 01**

මොනරාගල මාගන්දනමුල්ල ග්‍රාම සේවා කොට්ඨාශයේ බන්දුල ලී මෝලට යාබදව පිහිටා ඇති රත්න මාවත නමින් දැනට භාවිතයට ගන්නා මාර්ගයේ දෙපස නිවාස 25 ක් පමණ ඉදිවෙමින් පවතින අතර සිරිගල රෝහල දක්වාද ගමන් කළ හැකි මෙම මාර්ගය සභාව මගින් කොන්ක්‍රීට් හෝ කාපට් කර ගැනීමට කටයුතු සලසා දෙන ලෙස17 දෙනෙකුගේ අත්සන් ලේඛණයක්ද සහිතව ප්‍රදේශවාසීන් විසින් කර ඇති ඉල්ලීම සඳහා මහ සභා අනුමැතිය ලබාදීම සුදුසු බවට ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ක්‍රිශාන්ත රත්නායක මහතා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදී.

එම යෝජනාව සුදුසු බවට රංජිත් රත්නායක ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

කාර්මික නිලධාරී මහතා යොදවා පරීක්ෂා කර බලා සභා අරමුදලින් දැනට ග්‍රැවල් යොදා මෙම මාර්ගය සකස් කර දීම සුදුසු බවට මහ සභාව ඒකමතිකව අනුමත කරන ලදී.

## 05.3 ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.එම්.ගුණවර්ධන මහතා විසින් සභාවට ඉදිරිපත් කරනු ලබන යෝජනා

**යෝජනා අංක 01**

වෙහෙරගල ග්‍රාම නිලධාරී වසමේ වේරගල පාසල ඉදිරිපිට සුසන්ත මහතාගේ නිවස අසලින් යන අතුරු මාර්ගයේ සභා අරමුදලින් ඉදිකිරීමට අනුමත බෝක්කුව ඉදිකිරීමට යාමේදී ඉඩමේ පවතින ගැටලුවක් නිසා එම ඉදිකිරීම් කටයුතු වලට බාධාවක් ඇති වී ඇති අතර එම බෝක්කුව පිහිටි ග්‍රාම නිලධාරී වසමේ අලුත්වත්ත ගමේ කිවුලේ ආර ගල්කන්ද විවේකාරාම විහාරස්ථානයට යන මාර්ගය විශාල පිරිසක් යන එන මාර්ගයක් වන බැවින් මෙහි විනාශ වී ඇති බෝක්කුව ඉදිකිරීම සඳහා මහ සභා අනුමැතිය ලබාදීම සුදුසු බවට ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.එම්.ගුණවර්ධනමහතා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදී.

එම යෝජනාව සුදුසු බවට ප්‍රදීප් විජේරත්න ගරු උප සභාපතිතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

කාර්මික නිලධාරී මහතා යොදවා පරීක්ෂා කර බලා අදාල නිර්දේශ වාර්තාවන් ලබා ගෙන මෙම බෝක්කුව සභා අරමුදලින් සකස් කර දීම සුදුසු බවට මහ සභාව ඒකමතිකව අනුමත කරන ලදි.

## 05.4 ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී සුනිල් අරංගල මහතා විසින් සභාවට ඉදිරිපත් කරනු ලබන යෝජනා

**යෝජනා අංක 01**

මාර්ග කාපට් කිරීමේ ව්‍යාපෘතිය යටතේ හොරොම්බුව ග්‍රාම නිලධාරී වසමේ ගල්වල පාර මේ වන විට කාපට් කිරීමේ කටයුතු සිදුකරගෙන යන බැවින් එහි අතුරා තිබූ ගලවා ඉවත් කරනු ලබන කුට්ටි ගල් යොදා එයට යාබදව ඇති පවුල් ගණනාවක්ම පරිහරණය කරනු ලබන සෝදා පාලුවට ලක්ව ගමනා ගමනයට අපහසු තත්වයක් ගෙන දී ඇති සමීර මහතාගේ හා රංජිත් මහතාගේ නිවස අසලින් ඇති මාර්ග දෙක සංවර්ධනය කර දෙන මෙන් ගම්වාසීන් විසින් කර ඇති ඉල්ලීම වෙනුවෙන් මහ සභා අනුමැතිය ලබාදීම සුදුසු බවට ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී සුනිල් අරංගල මහතා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදි.

එම යෝජනාව සුදුසු බවට චාමර නානායක්කාර ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.
හොරොම්බුව ගල්වල පාර කාපට් කිරීමේදී ගලවා ඉවත් කරන කුට්ටි ගල් යොදා විධිමත් ක්‍රමවේදයන්ට යටත්ව මෙම අතුරු මාර්ග දෙක සංවර්ධනය කර දීම සුදුසු බවට මහ සභාව ඒකමතිකව අනුමත කරන ලදි.

**යෝජනා අංක 02**

කුඹුක්කන 2 කණුව ප්‍රදේශයෙහි පිහිටා ඇති ක්‍රීඩා පිට්ටනිය ප්‍රදේශයේ තරුණ ප්‍රජාව විසින් නිරතුරුව ප්‍රයෝජනයට ගන්නා ස්ථානයක් වන අතර විශේෂයෙන්ම විවිධ ඇබ්බැහිවීම් වලට යොමුවන තරුණ ප්‍රජාවට ඉන් මිදී ක්‍රීඩා කටයුතු වලට යොමු වී ඵලදායි පුද්ගල සංවර්ධනයක් ඇති කරගැනීමට මෙම ක්‍රීඩා පිට්ටනිය කාලෝචිත වශයෙන් ඉතා වැදගත් වන අතර මේ වන විට අබලන් තත්ත්වයේ පවතින මෙම භූමිය බැකෝ යන්ත්‍රය යොදවා සභාව මගින් එය සුදුසු ආකාරයට සකස් කර දීම සඳහා මහ සභා අනුමැතිය ලබාදීම සුදුසු බවට ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී සුනිල් අරංගල මහතා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදි.

එම යෝජනාව සුදුසු බවට කේ.එම්.ගුණවර්ධන ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

සභාවේ බැකෝ ලෝඩර් යන්ත්‍රය යොදවා මෙම ක්‍රීඩා පිටිය සකස් කර දීම සුදුසු බවට මහ සභාව ඒකමතිකව අනුමත කරන ලදි.

- **කල් දී නොමැති හදිසි යෝජනා ඉදිරිපත් කිරීම (රීති අංක 11 (8) )**

න්‍යායපත්‍රානුකූලව යථා පරිදී කල්දී ඇති යෝජනා සාකච්ඡා කිරීමෙන් අනතුරුව අද දින සාකච්ඡා කර අනුමැතිය ගත යුතු කල් දී නොමැති හදිසි යෝජනා කිහිපයක් සම්බන්ධයෙන් මහ සභා අනුමැතිය ලබා ගත යුතු බවට ගරු සභාපතිතුමා සභාවට ප්‍රකාශ කළ අතර, ඒ සඳහා මහ සභාවේ විරුද්ධත්වයක් නොමැතිව එකඟතාවය පළ කර සිටි බැවින් ගරු සභාපතිතුමා විසින් එම හදිසි යෝජනා පහතින් දක්වා ඇති ආකාරයට සභාගත කරන ලදි.

I. ප්‍රාදේශිය සංවර්ධන සහයක ව්‍යාපෘති යටතේ දෙවන මූලික වාරිකය යටතේ (BT) මොනරාගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල ක්‍රියාත්මක කිරීමට තෝරාගෙන ඇති පහත උප ව්‍යාපෘති දෙක සඳහාත් ඒ වගේම මේ සඳහා පවත්වාගෙන යාමට පත් කර ඇති පහතින් දක්වා ඇති ප්‍රසම්පාදන කමිටුවත්, තාක්ෂණික ඇගැයීම් කමිටුවත්, සමාජ විගණන කමිටුවත් සඳහාත් මහ සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු බව ප්‍රාදේශීය සභා ගරු සභාපති විසින් මහ සභාව වෙත ඉදිරිපත් කරනු ලබන යෝජනාව.

- <u>තෝරාගෙන ඇති අදාල උප ව්‍යාපෘති</u>

1) මොණරාගල නගරයේ නව බස්නැවතුම් පොළ භූමියේ වැසිකිළි පද්ධතියක් සහ පොදු පහසුකම් මධ්‍යස්ථානයක් ඉදිකිරීම.

2) මොණරාගල පැරණි බස් නැවතුම්පළ පිහිට භූමියේ රථ ගාලක් ඉදි කිරීම.

❖ <u>ඒ සඳහා යෝජනා කර ඇති කමිටු</u>

<u>ප්‍රසම්පාදන කමිටුව</u>

- ආර්.එම්. රත්නවීර මැතිතුමා, සභාපති ,ප්‍රාදේශිය සභාව, මොනරාගල - සභාපති
- සුනිල් අරංගල මැතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - සාමාජික
- තමෝදිරම් ජයජීපන් මැතිතුමා ,ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - සාමාජික
- ප්‍රදීප් ධම්මික විතානගේ මැතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - සාමාජික
- අනුර දිසානායක මහතා, සභා ලේකම් - සාමාජික
- එම්.එම්.යූ.හේරත් මයා ,විමර්ශන නිලධාරී - සාමාජික
- මාලක සුරංග මහතා ,සංවර්ධන නිලධාරී - සාමාජික

<u>තාක්ෂණික ඇගයීම් කමිටුව</u>

- ජේ.එම්.ජී.ඉඳුනිල් මයා, දිස්ත්‍රික් ඉංජිනේරු - සභාපති
  ප්‍රාදේශීය සංවර්ධන සහයක ව්‍යාපෘතිය
- ආර්.එස්.දර්ශන රුවන් කුමාර,
  සංවර්ධන නිලධාරී පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය - සාමාජික
- සරත් කුමාර වනසිංහ මයා,
  තාක්ෂණ නිලධාරී ප්‍රා දේශීය සභාව මොනරාගල - සාමාජික

<u>සමාජ විගණන කමිටුව</u>

- ඩබ්ලිව්.ජී. රණසිංහ මයා, දුටුගැමුණු පාර ,මොණරාගල
- ආර්.එම්.විජේරත්න මයා, දඹේපිටිය, විහාරමුල්ල ,මොනරාගල
- ඩබ්ලිව්.ආර්.එන්.ප්‍රනාන්දු මයා, දුටුගැමුණු පාර, මොනරාගල,
- ඩබ්ලිව්.එම්. අනුර විජේකෝන් මයා, දුටුගැමුණු පාර, මොනරාගල
- කේ.එම්.පද්මා හේමලතා මිය, තිස්සපාර, මොණරාගල
- ජී.එම්.ජේ. ප්‍රදීපා ද සිල්වා මිය, ධර්මෝදය මාවත, මොණරාගල
- ඒ.එම්. චාන්දනී කාන්ති බණ්ඩාර මිය, විහාරමුල්ල මොනරාගල

**එම යෝජනාව සුදුසු බවට සුනිල් අරංගල ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.**

**මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.**

**ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.**

ප්‍රාදේශිය සංවර්ධන සහයක ව්‍යාපෘති යටතේ 2 වන මූලික වාරික මුදලට අදාලව ක්‍රියාත්මක කිරීමට තෝරා ගෙන ඇති මෙම උප ව්‍යාපෘති 2 සඳහාත්, ඒ වගේම මෙම ව්‍යාපෘති දෙක මොනරාගල නගරය තුල ක්‍රියාත්මක වන හෙයින් ඒ සඳහා වෙන් වෙන් වශයෙන් ඉහත කමිටු වෙන වෙනම පත් කිරීමක් අවශ්‍ය නොවන බැවින් දැනට මෙම කමිටු 3 සඳහා තෝරාගෙන ඇති මෙම සාමාජිකයින්ම උප ව්‍යාපෘති දෙකම ක්‍රියාත්මක කිරීමේදී අදාල කටයුතු වෙනුවෙන් සහභාගී කරවා ගැනීම සඳහා සභා අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු මහ සභාව ඒකමතිකව අනුමත කරන ලදී.

II මොණරාගල ප්‍රාදේශිය සභාවට අයත් ඉදිකිරීම් සංවර්ධන කටයුතු වල දී ඉදිකිරීම් ද්‍රව්‍ය සහ උපාංග වල මිල ගණන් සහ ඇස්තමේන්තු සකස් කිරීමට ලබා දී ඇති BSR සහ HSR මිල ගණන් වර්තමාන මිල ගණන් සමඟ සැසඳීමේ දී සැලකිය යුතු වෙනසක් පවතින බැවින් ඇස්තමේන්තු සකස් කිරීමට සහ කාර්යාලයට අවශ්‍ය උපාංග ලබා ගැනීමට නොහැකි තත්ත්වයක් උද්ගත පවතින අතර කොන්ත්‍රාත්කරුවන් ද මහත් අපහසුතාවයට පත්ව තිබීම නිසා මෙම සම්බන්ධයෙන් 2022.01.11 දින මොණරාගල දිස්ත්‍රික්ක භාරව කටයුතු කරන ජ්‍යෙෂ්ඨ කාර්මික නිලධාරි මහතාගේ උපදෙස් වලට අනුව වර්තමාන මිල ගණන් පදනම් කරගෙන ඉදිකිරීම් සංවර්ධන කටයුතු සඳහා අදාල ඇස්තමේන්තු සකස් කිරීමට සිදු වන බවත් එහිදී මිල විචලනයන් හෝ 2022 වර්ෂයේ අනුමත මිල ගණන් (BSR සහ HSR ) පදනම් කර ගනිමින් ඇස්තමේන්තු සකස් කිරීම් හා ගෙවීම් කටයුතු සිදු කිරීම ආදී කටයුතු සඳහාත් එසේම 2021 වර්ෂයට අදාලව පදනම් කර ගත් BSR සහ HSR අනුව සකස් කරන ලද ඇස්තමේන්තු වලට අදාල කොන්ත්‍රාත් සිදු කිරීමේදී රටේ පැවති තත්ත්වයන් මත ඉදිකිරීම් සම්බන්ධ ද්‍රව්‍ය වල මිල ගණන් සීඝ්‍ර ලෙස අවස්ථා කිහිපයකදීම වැඩි වන ලද අතර මෙම මිල ගණන් යටතේ කොන්ත්‍රාත් කිරීමේදී අදාල සමිති විශාල දුෂ්කරතායන්ට මුහුණ දීමට සිදු වූ අතර කර්මාන්ත අතහැර දැමීමට පවා යම් යම් අවස්ථාවලදී ඔවුන් විසින් ඉල්ලීම් කරන ලැබූ අතර මෙම තත්ත්වයන් යටතේ වුවද ඔවුන් මෙම කර්මාන්තයන් සිදු කර අවසන් කිරීමට මාගේ නියෝගයන් පරිදි කටයුතු කරන ලදි. එබැවින් වෙළඳපොළේ මිල විචලනයන් පදනම් කර ගනිමින් එම මිල විචලනය වූ පදනම යටතේ ද අදාල බිල් පත් සකස් කර ගෙවීම් කටයුතු සිදු කිරීමට ද මහ සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපති විසින් මහ සභාව වෙත ඉදිරිපත් කරනු ලබන යෝජනාව.
එම යෝජනාව සුදුසු බවට කේ.එම්.ගුණවර්ධන ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

වර්තමානය වන විට රටේ පවතින තත්ත්වයන් මත ඉදිකිරීම් කටයුතු සඳහා යොදවා ගන්නා භාණ්ඩවල පවතින හිඟය හා ඒවායේ අධික මිලගණන් හේතුවෙන් සංවර්ධන ඇස්තමේන්තු සකස් කිරීමට පදනම් කර ගන්නා BSR, HSR රේට් ගණන් වලින් සඳහන් ද්‍රව්‍ය වල මිල ගණන් ඉක්මවා යනු ලබන බැවින් මේ හේතුව නිසා කොන්ත්‍රාත් කටයුතු කරන පාර්ශවයන්ද ඉතාමත් අපහසුතාවයන්ට මුහුණ දෙමින් විශාල වශයෙන් පාඩු ලබන අවස්ථාද ඇති බැවින් වර්තමාන මිල ගණන් පදනම් කරගෙන ඉදිකිරීම් සංවර්ධන කටයුතු සඳහා අදාල ඇස්තමේන්තු සකස් කිරීමත්, එහිදී මිල විචලනයන් හෝ 2022 වර්ෂයේ අනුමත මිල ගණන් (BSR සහ HSR ) පදනම් කර ගනිමින් ඇස්තමේන්තු සකස් කිරීම් හා ගෙවීම් කටයුතු සිදු කිරීම් වලට අදාල සියලු කටයුතු සිදු කිරීම සුදුසු බවටත් එසේම 2021 වර්ෂයට අදාලව පදනම් කර ගත් BSR සහ HSR අනුව සකස් කරන ලද ඇස්තමේන්තු වලට අදාල කොන්ත්‍රාත් සිදු කිරීමේදී අදාල වෙළඳපොළ මිල විචලනයන් පදනම් කර ගනිමින් එම මිල විචලනය වූ පදනම යටතේ ද අදාල බිල් පත් සකස් කර කිසිඳු පාර්ෂවයකට ඇඩි අලාභයක්, පාඩුවක් සිදු නොවන පරිදි අදාල ගෙවීම් කටයුතු ද විධිමත් ක්‍රමවේදයන්ට යටත්ව සිදු කිරීම සුදුසු බවට ගරු මහ සභාව ඒකමතිකව අනුමත කරන ලද අතර මේ සම්බන්ධව පළාත් පාලන කොමසාරිස් තුමන් වෙතද දන්වා යැවීමට කටයුතු කරන ලෙසද සභාව දන්වා සිටින ලදී.

ඒ වගේම ග්‍රාම නිලධාරී වසමකට ලක්ෂ 20 බැගින් ලබා දී ඇති ව්‍යාපෘතියට අදාල සංවර්ධන කටයුතු වලදී මේ වන විට වෙළඳපොලේ සිමෙන්ති වල මිල ගණන් වැඩි වීම සම්බන්ධයෙන් පැන නැගී ගැටලුකාරී තත්ත්වය නිසා මෙම ව්‍යාපෘති භාර ගන්නා කොන්ත්‍රාත් සමිති සඳහා බිල්පත් වටිනාකමින් අය කරනු ලබන 5%ක් වන මුදල වෙනුවට වෙළඳපොළෙහි පවතින මෙම තත්ත්වය යතා තත්ත්වයට පත්වන තෙක් 1%ක් වැනි මුදල් ප්‍රතිශතයක් අය කිරීමට පියවර ගන්නා ලෙස අදාල සමිති දැනුවත් කිරීම සඳහා ගොවිජන සේවා කොමසාරිස් තුමාටත්, ප්‍රාදේශීය ලේකම් තුමාටත්, ග්‍රාමසංවර්ධන අධ්‍යක්ෂ තුමාටත් දැනුම් දීමක් සිදු කර අනුමැතිය ලබා ගැනීමට කටයුතු කිරීම සුදුසු බවටත් මහ සභාව ඒකමතිකව අනුමත කරන ලදි.

II. මොනරාගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ප්‍රජා මණ්ඩල පිහිටුවීම සඳහා 2022 ජනවාරි මස 11 වන දින සූම් තාක්ෂණය ඔස්සේ දැනුම් දීමේ වැඩසටහනක් පැවති අතර එහිදී දැනට ප්‍රජා මණ්ඩල නොමැති ග්‍රාම නිලධාරී වසම් වල ප්‍රජා මණ්ඩල ඇති කිරීම සඳහා උපදෙස් ලබාදී ඇති බැවින් ඒ සඳහා මහ සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු බව ප්‍රාදේශීය සභා ගරු සභාපති විසින් මහ සභාව වෙත ඉදිරිපත් කරනු ලබන යෝජනාව.

එම යෝජනාව සුදුසු බවට චාමර නානායක්කාර ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මදුරුකැටිය, හිදිකිවුල,වැලියාය,අලියාවත්ත යන ප්‍රදේශ වල මේ වන විට ප්‍රජා මණ්ඩල පිහිටුවා ඇති අතර එම ව්‍යාපෘති හරහා සැහීමකට පත් විය හැකි ආකාරයේ සංවර්ධන කටයුතු මෙමගින් සිදු කර ඇති අතර ග්‍රාම නිලධාරී වසම් 26 ම ප්‍රජා මණ්ඩල කමිටු පිහිට විය යුතු බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටින ලදි.

ඉතා හොඳ යෝජනාවක් වන අතර හිදිකිවුල ප්‍රදේශයට මෙම ව්‍යාපෘතිය හරහා ලක්ෂ 40 ක පමණ ප්‍රතිපාදන ලැබුණු අතර සම්පූර්ණ මාර්ගයක් සහ බෝක්කුවක් එමගින් සංවර්ධනය කර ගැනීමට හැකි වූ බව චාමර නානායක්කාර ගරු මන්ත්‍රීතුමා සඳහන් කර සිටින ලදි.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා සිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

මේ වන විටත් ප්‍රජා මණ්ඩල පිහිටුවා නොමැති මොනරාගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සියලුම වසම් නියෝජනය වන පරිදි ප්‍රජා මණ්ඩල පිහිටුවීම සහ පවත්වාගෙන යාම සුදුසු බවට ගරු මහ සභාව ඒකමතිකව අනුමත කරන ලදී.

## 06. <u>ආදායම් වියදම් වාර්තාව සහා සම්මත කිරීම</u>

න්‍යායපත්‍රානුකූලව පසුගිය මාසයට අදාළව ඉදිරිපත් කර ඇති ආදායම් වියදම් වාර්තාව සභා සම්මත කර ගන්නා ලෙසට ගරු සභාපතිතුමා විසින් ගරු සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

පසුගිය මාසයේ එනම් 2021.12.01 දින සිට 2021.12.31 දින දක්වා වන ආදායම් වියදම් වාර්තාව චාමර නානායක්කාර ගරු මන්ත්‍රීතුමන්ගේ සහ සුනිල් අරංගල ගරු මන්ත්‍රීතුමන්ගේ යෝජනා ස්ථිරත්වයෙන් සභාවේ විරෝධතාවයන්ද නොමැතිව පිළි ගැනීම සුදුසු බවට ගරු සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

## 07. කමිටු වාර්තා සලකා බැලීම - ඉදිරිපත් වී නොමැත

## 08. වෙනත් කරුණු ඉදිරිපත් කිරීම

න්‍යායපත්‍රානුකූලව මීලඟට ඇත්තේ වෙනත් කරුණු ඉදිරිපත් කිරිම බැවින්,වෙනත් කරුණු සමඟම සභිකවරුන්ට අදහස් ප්‍රකාශ කිරීමට ඇත්නම් ඒ වෙනුවෙන් ගරු සභාවට අවසර ලබා දෙන බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කර සිටින ලදි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - වයි.ආර්.උපුල් මැතිතුමා**

I. ගරු සභාවෙන් අවසර ගැනීමෙන් අනතුරුව ප්‍රදේශයේ හේන් ගොවිතැන් සම්බන්ධව කතා කිරීමේදී මේ වන විට බොහෝ ගොවීන් හට වගා භූමි සම්බන්ධව විවිධ ගැටලුකාරී තත්ත්වයන් උද්ගතව පවතින බැවින් මෙම ඉඩම් අක්කර පහ නිරවුල් කර ඔවුන්ට බාරදෙන තෙක් දැනට හේන්වල රැඳී සිටිමින් හේන් ගොවිතැන් කරන අයට ඒ සඳහා අවස්ථාව ලබා දෙන ලෙසත් ඒ වගේම එම ඉඩම් වල ස්ථිර වගාවන් සිදු කරන අතරතුර එම පරිශ්‍ර වල එදිනෙදා ජීවත් වීමට අත්‍යවශ්‍ය වන තාවකාලික බෝග වගාවන් ද සිදු කරගෙන යාමටත් එම ගොවීන්ට අවශ්‍ය කරන සහයෝගය ලබා දෙන ලෙස ගරු මන්ත්‍රී තුමන් සඳහන් කර සිටි අතර මේ සම්බන්ධයෙන් අතිගරු ජනාධිපතිතුමන් ඇතුළු වග කිව යුතු ඉහළ දේශපාලන අධිකාරිය දැනුවත් කර මෙම ඉඩම් වල අයිතිය ගොවීන්ට ලබාදීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙස සඳහන් කර සිටින ලදි.

ඒ වගේම මොණරාගල මහානාම ජාතික පාසලට උසස් පෙළ අධ්‍යයන කටයුතු සඳහා නව වසරේ ඇතුළත් වූ දරුවන්ට පුටු සහ මේස වල හිඟයක් පාසලේ පවතින බැවින් රටේ පවතින තත්ත්වයත් සමග මේ මොහොතේ දෙමාපියන්ටද මුදල් වියදම් කිරීම අපහසු තාවයක් පවතින බැවින් අධ්‍යාපන ඇමතිතුමන්, කෘෂිකර්ම රාජ්‍ය ඇමැතිතුමන්ව හා කලාප අධ්‍යක්ෂක ද දැනුවත් කර මෙම දරුවන්ට අවශ්‍ය පුටු මේස ටික ඉතා කඩිනමින් ලබා දීමට කටයුතු සලසා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා සඳහන් කර සිටින ලදි.

ඒ වගේම ප්‍රදේශයේ අතුරු මාර්ග සකස් කර ගැනීම සඳහා අවශ්‍ය j.c.b. යන්ත්‍රය එක් දිනකට හෝ ලබාදීම සම්බන්ධව ස්තූතිවන්ත වන අතර ඉතිරි මාර්ග කොටස් ද කපා සකස් කරගැනීමට නැවත වතාවක් ලබා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා සඳහන් කරමින් සියළු දෙනාටම ස්තූතිය පුද කර සිටින ලදි.

**ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දීම**

මහානාම විදුහලේ පුටු සහ මේස හිඟයක් පවතින්නේ පසුගිය වර්ෂයේ උසස් පෙළ දරුවන් තවමත් පාසලේ රැඳී සිටීම හේතුවෙන් වන අතර වෙනත් අවට පාසල්වල වැඩිපුර පවතින පුටු මේස ටිකක් මේ වෙලාවේ කඩිනම් අවශ්‍යතාවයට අනුව ලබාදීමට දැනටමත් කටයුතු කර ඇති බවට ගරු සභාපතිතුමා සඳහන් කර සිටින ලදි.

j.c.b. එක හෙට දිනයේ ලබාදිය ලබා දිය හැකි බවත්, ඒ වගේම ගොවි ගම්මානවල ඉඩම් ප්‍රශ්නය මේ වනවිටත් අපගේ කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමන් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ දී අදාළ නිලධාරීන්ගේ අවධානයට යොමු කර ඇති අතර මිනින්දෝරු මහත්වරුන්ගේ මැනුම් කටයුතු වල සහ අදාල ඇමතිතුමන්ගේ පවතින අඩු පාඩු දුර්වලතා හේතුවෙන් මෙම ගැටළුකාරී තත්වය පවතින බවත් ඉදිරි දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ දී අපි සියලු දෙනා එකතුවෙලා

අදාල ගොවියන් ටික ගෙන්නලා හරි මේ සඳහා විසඳුමක් ලබාගැනීමට කටයුතු කරමු බවට ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටින ලදි.

**<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති - ප්‍රදීප් විජේරත්න මැතිතුමා</u>**

I. ගරු සභාවෙන් අවසර ගැනීමෙන් අනතුරුව ප්‍රදේශයේ ගොවීන්ගේ උද්ගතව ඇති මේ ඉඩම් ප්‍රශ්නය සඳහා දිස්ත්‍රික් දේශපාලන අධිකාරිය වශයෙන් පූර්ණ වශයෙන් මැදිහත් වී අප කටයුතු කළ යුතු අතර මෙම ගොවීන්ගේ අක්කර පහ භූමි ප්‍රදේශ අදාල ගොවීන්ට ලබා දෙන තෙක් ඔවුන් විසින් වගා කරන ලද ඉතිරි ඉඩම් ටික දිගටම වගා කටයුතු කරගෙන යාම සඳහා අවස්ථාව ලබා දෙන ලෙසත්, ඒ වගේම අවස්ථා ගණනාවකදීම මේ සම්බන්ධයෙන් තමන් මැදිහත් වී ප්‍රාදේශීය ලේකම්, II.දිස්ත්‍රික් ලේකම් තුමා, වන සංරක්ෂණ දෙපාර්දෙපාර්තමේන්තුව, සමග සාකච්ඡා කරමින් යෝජනා ඉදිරිපත් කර ඇති අතර ඒ අනුව ලබා දෙන උපදෙස් අනුව එම ඉඩම්වල රුක් රෝපණ වගාවන් සිදුකිරීමටත්, ඊට අමතරව අනෙකුත් වගාවන් ද ඒ අතර ම පවත්වාගෙන යාමට ගොවීන් එකඟතාවය ලබා දී බොහෝම සාධාරණ ඉල්ලීම් කළද ඒ එකදු ඉල්ලීමකටවත් අදාල අමාත්‍යවරයා ඇහුම්කම් නොදීම ඉතාමත් කණගාටුවට කරුණක් වන අතර යම් යම් නිලධාරීන්ගේ අවවාද උපදෙස් මත මෙම අමාත්‍යවරයා ක්‍රියා කිරීම තුළින් රජය අපහසුතාවයට පත් කිරීමක් හා කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍ය තුමන්ට ද යම් බලපෑමක් ගෙන දීමට උත්සාහ කිරීමක නිරතවනවාද යන්න සැක සහිත බව ගරු උප සභාපතිතුමා ප්‍රකාශ කර සිටින ලදි.

II. ඒ වගේම ජනතාව නියෝජනය කරමින් මෙම ඉඩම් ප්‍රශ්නය හමුවේ නැවත ගොවියන් සමග සෘජුවම සිටින අයකු වශයෙන් විමලවීර වනජීවී ගරු අමාත්‍යතුමාට අසරණ ගොවීන්ගේ දුක තේරුම් ගැනීමට නොහැකි නම් මෙම ධුරයෙන් ඉවත්වී කරන්න පුළුවන් කෙනෙකුට භාර දී ඉවත් වන ලෙසට තමන් මේ සභාවට යෝජනා කර සිටින බවට ගරු උප සභාපතිතුමන් ප්‍රකාශ කර සිටි අතර ඒ වගේම පසුගිය දිනකදී මෙම ගොවියන්ගේ ප්‍රදේශයට ගිය වන සංරක්ෂණ නිලධාරීන් පිරිසක් විසින් අහිංසක ගොවියන් කිහිපදෙනකු ලණුවලින් අත් බැඳ ඔවුන්ගේ ට්‍රැක්ටර් රථ සමඟ අත් අඩංගුවට ගෙන ඇති අතර මෙයින් කලබලයට පත් ප්‍රදේශයේ අනෙකුත් ගොවියන්ගේ මැදිහත් වීමෙන් මොවුන්ව නිදහස් කරගැනීමට හැකි වී ඇති අතර මේ ගොවීන්ගේ සටන නිරවුල් කර ගන්නා තෙක් අපි ඔවුන් සමග සිටින බවත් ඉතාමත් කඩිනමින් මේ සඳහා විසඳුමක් ලබාදීමට කටයුතු කරන්න කියා ගරු උප සභාපතිතුමා ඉල්ලීම් කරමින් සියළු දෙනාටම ස්තූතිය පුද කර සිටින ලදි

**<u>ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දීම</u>**

- අද වන විට මේ සඳහ ගත හැකි එකම විසඳුම වන්නේ මේ අදාල අමාත්‍යවරයා කෙසේ හෝ මොණරාගල ප්‍රදේශයට ගෙන්වාගෙන ගොවීන්ද සමඟ මේ ප්‍රශ්නයට විසඳුමක් ලබාදීමට කටයුතු කිරීම බව ගරු සභාපතිතුමා සඳහන් කර සිටින ලදි

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - අතුල කුමාරසිරි මැතිතුමා</u>**

I. ගරු සභාවෙන් අවසර ගැනීමෙන් අනතුරුව පසුගිය සභා වාරයකදී තමන් විසින් ඉදිරිපත් කළ කාරණාවකට අනුව ප්‍රාදේශීය සභාව මැදිහත් වී බිබිල පාර 22කණුව බුදුපිළිමය අසල පාරට නැමී තිබූ අනතුරුදායක ගස ඉවත් කිරීම සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා ඇතුළු සියළු දෙනාටම ස්තූතිය පුදකර සිටින බව ගරු මන්ත්‍රීතුමන් සඳහන් කර සිටින ලදි

II. ඒ වගේම තවත් කාරණාවක් වශයෙන් නගරයේ පැරණි බස් නැවතුම්පොළට වාහන ඇතුලත් කල පසු එම වාහන වටේම නවතා තැබීම හේතුවෙන් එසේ ඇතුළත් කළ වාහනයක් නැවත එලියට ගැනීමේදී ඉතාමත් අපහසු තත්ත්වක් ගෙන දෙන බැවින් මේ සම්බන්ධයෙන් සොයා බලා අවශ්‍ය කටයුතු සිදු කිරීමට අවධානය යොමු කරන්න කියා ගරු මන්ත්‍රීතුමන් සඳහන් කර සිටින ලදි.

III. ඒ වගේම නගරයේ ගවමස් කඩයේ මස් විකිණීමේදී කිරුම් කටයුතු වලදී යම් යම් අකටයුතු සිදුවන බවට ජනතාව විසින් චෝදනා ඉදිරිපත් කර ඇති බැවින් මේ සම්බන්ධයෙන් සොයා බැලීමක් සිදු කර අවශ්‍ය කටයුතු සිදු කරන්න කියා ප්‍රකාශ කරමින් ගරු මන්ත්‍රිතුමා සියලු දෙනාටම ස්තූතිය පුද කර සිටින ලදි.

<u>**ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දීම**</u>

- නගරයේ ගව මස් වෙළඳසැල සම්බන්ධයෙන් එසේ ගැටළුවක් පවතින බවට තමන්ට මෙතෙක් ආරංචියක් නොලැබුණු අතර ලබන සතියෙම එහි වෙළඳ හිමිකරු සභාවට ගෙන්වාගෙන අවශ්‍ය උපදෙස් ලබා දෙන බවට ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටින ලදී ඒ වගේමපැරණි බස්නැවතුම්පලේ ගැටළුව සම්බන්ධයෙන් ද සොයා බලා අවශ්‍ය කටයුතු කරන්නම් කියා ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටින ලදි

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - චාමර නානායක්කාර මැතිතුමා**</u>

I. ගරු සභාවෙන් අවසර ගැනීමෙන් අනතුරුව මේ වන විට කතා නොකරම බැරි මතෘකාවක් වශයෙන් තෙනගල්ලන්ද, ඉත්තෑකටුව, කලු දිය ඇල්ල ආදී ප්‍රදේශ වල හේන් ගොවියන්ගේ ඉඩම් සඳහා සාධාරණයක් ඉටු විය යුතු අතර මේ සඳහා මූලික වශයෙන් වගකිව යුතු වන වනජීවී ඇමතිතුමන් ජනතාවගේ දරිද්‍රතාව, පීඩනය ආදී ගැටලු කුමක්ද යන්න ජනතාවගේ දුක හඳුනන පුද්ගලයෙකු වශයෙන් මේ ගොවියන්ගේ ප්‍රශ්නයට විසඳුමක් ලබා නොදීම පුදුමයට කරුණක් වන අතර කෙසේ වෙතත් මේ සඳහා මැදිහත් වී විසඳුමක් ලබාදීමට කඩිනමින් කටයුතු කළ යුතු බවට ගරු මන්ත්‍රිතුමා සඳහන් කර සිටින ලදි.

II. ඒ වගේම බිබිල පාර කච්චේරිය අසල වූ උද්‍යානයේ ඇවිදින මං තීරු වල කුට්ටි ගල් අල්ලා සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් ගරු සභාපතිතුමන් ඇතුළු සියලුදෙනාටම ස්තූතිය පුද කර සිටින බවත්, ඒ වගේම මෙම ඇවිදින මංතීරු සඳහා සෝලා පද්ධතිය සහිත විදුලි ලාම්පු කිහිපයක් සවි කර වැඩි ආලෝකයක් ලබාදීම සම්බන්ධයෙන්ද අවධානය යොමු කර අවශ්‍ය කටයුතු සිදු කර දෙන ලෙස ගරු මන්ත්‍රිතුමා සඳහන් කර සිටින ලදි.

III. ඒ වගේම ග්‍රාම නිලධාරී වසමකට ලක්ෂ 20 බැගින් ලබා දීමේ ව්‍යාපෘතියට අදාල කටයුතු සිදු කර ගෙන යාමේදී මේ වන විට වෙළඳපොලේ සිමෙන්ති වල මිල ගණන් වැඩි වීම සම්බන්ධයෙන් ගැටලුවක් පැන නැගී ඇති අතර මෙම ව්‍යාපෘති භාර ගන්නා කොන්ත්‍රාත් සමිති වලට 1% ක් ගන්න හැකියාවක් පවතින බැවින් ගොවිජන සේවා කොමසාරිස් තුමාටත්, ප්‍රාදේශීය ලේකම් තුමාටත්, ග්‍රාමසංවර්ධන අධ්‍යක්ෂ තුමාටත් දැනුම් දීමක් සිදු කර සාකච්ඡා කර මේ සඳහා වැඩපිළිවෙළක් සකස් කර යම් විසඳුමක් ලබා දීමට කටයුතු කර දෙන ලෙස ගරු මන්ත්‍රී තුමා සඳහන් කර සිටින ලදි.

IV. ඒ වගේම ආර්ථික දරිද්‍රතාවය මත ජීවනෝපාය සංවර්ධනයට මේ වන විට රටේ විශාල මුදලක් වෙන්කර ඇති අතර යටිතල පහසුකම් වශයෙන් මාර්ග කාපට් කිරීමේ විශාල ව්‍යාපෘති වල කටයුතු සිදු වෙමින් පවතින අතර මෙම කාලය ඉතා හොඳින් කළමනාකරණය කරගනිමින් අපි සියලු දෙනාම ඉතාමත්ම සහයෝගයෙන් මෙම වැඩකටයුතු නිසි ලෙස අවසන් කර ගැනීමට කටයුතු කරමු බව ප්‍රකාශ කරමින් ගරු මන්ත්‍රීතුමා සියළු දෙනාටම ස්තූතිය පුදකර සිටින ලදී.

**<u>ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දීම</u>**

- ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතිය යටතේ කියාත්මක වන කාර්යය සාධන ව්‍යාපෘති 2 අදියර යටතේ වෙන් කර ඇති මිලියන 10 ප්‍රතිපාදන යටෙත් බිබිල පාර උද්‍යානයට ද අවශ්‍ය sola විදුලි බල්බ සවි කිරීමට කටයුතු ඉදිරියේදී සිදු කරමු බවත් , ඒ වගේම ගොවියන්ගේ ඉඩම් ප්‍රශ්නයට විසඳුමක් නොලැබුණහොත් අපි සියලු දෙනාම එකතු වී උද්ඝෝෂණයක් හරි සිදු කර විසඳුමක් ලබාගැනීමට කටයුතු කරමු යන්න ගරුසභාපතිතුමා ප්‍රකාශ කර සිටින ලදි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.එම්.ගුණවර්ධන මැතිතුමා</u>**

I. ගරු සභාවෙන් අවසර ගැනීමෙන් අනතුරුව ගොවීන්ගේ ඉඩම් ප්‍රශ්නය පසුගිය මහා සභා වාරයේදී සාකච්ඡා කළ අතර ප්‍රධාන අමාත්‍ය තුමන් සමග ද සාකච්ඡා කර මේ සඳහා ඉතා කඩිනමින් විසඳුමක් ලබාදීමට කටයුතු කරන්න කියා ගරු මන්ත්‍රීතුමා සඳහන් කර සිටින ලදි.

II. ඒ වගේම මොණරාගල නගරයේ සියලු කටයුතු ගරු සභාපති තුමන්ගේ මගපෙන්වීම යටතේ ඉතාමත්ම සාර්ථකව සිදුකරගෙන යන අතර මන්ත්‍රීවරුන්ගේ ද යුතුකමක් වන්නේ සතියකට දිනක් හෝ නගරය වෙත ගොස් පරික්ෂා කර බලා අඩු පාඩු ඇත්නම් ඒවා පෙන්වා දී නිවැරදි කරගැනීම සඳහා සහයෝගය ලබා දෙන ලෙසත්, ඒ අනුව නගරයේ සඳළුව වෙළඳසැල ඉදිරිපිට මඩ වලවල් කීපයක් සකස් වී ඇති බවත් ඒ වගේම එවැනි අපිරිසිදු තැන් කිහිපයක්ම නගරයේ ඇති බැවින් මේ සම්බන්ධව සොයා බලා ඒවා සකස් කර නගරය ලස්සනට පිරිසිදුව පවත්වාගෙන යාමට නිරතුරුවම අවධානයෙන් සිටිමු බවට ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කර සිටින ලදි.

III. ඒ වගේම අපගේ සභා පරිශ්‍රයට පුංචි බුදු මැදුරක් සකස් කර තිබීම ඉතාමත් වැදගත් කටයුත්තක් වන බැවින් මේ වර්ෂය තුළ වත් බුදු මැදුරක් ඉදිකිරීම සඳහා අවධානය යොමුකර අදාල කටයුතු කරමු බවට ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කර සිටින ලදි.

IV. ඒ වගේම වෙහෙරගල කලු දිය ඇල්ල ප්‍රදේශයේ විශාල වැලි සම්පතක් පවතින අතර මෙය සභාවට පවරා ගෙන එම ප්‍රදේශයේ අයට අඩු මිලටත් බාහිර අයට පවතින මිලටත් වැලි ලබා දී ආයතනයට ආදායමක් එන වැඩපිළිවෙළක් සකස් කරගත හැකි බැවින් ඒ සම්බන්ධව අවධානය යොමුකර අවශ්‍ය කටයුතු සිදු කරන්න කියා ගරු මන්ත්‍රීතුමා සඳහන් කර සිටින ලදි.

V. ඒ වගේම ප්‍රාදේශීය සභා ඉදිරි කාලය තුළද ගරු සභාපතිතුමාටත්, මන්ත්‍රීවරුන්ටත් ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයටත් ප්‍රදේශයේ දියුණුව වෙනුවෙන් සාර්ථකව කටයුතු කිරීමට සුබ පතමින් ගරු මන්ත්‍රීතුමා සියළු දෙනාටම ස්තූතිය පුදකර සිටින ලදී.

**<u>ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දීම</u>**

- වැලි ගබඩාවක් පවත්වාගෙන යාම සඳහා බලපත්‍ර ලබාගත යුතු බැවින් ඒ සම්බන්ධයෙන් සොයාබලා කටයුතු කරමු බවත්, ඒ වගේම නගරයේ සඳළුව වෙළඳසැල ඉදිරිපිට වාහන නැවතුම් පොළක් සකස් කිරීමට ව්‍යාපෘතියක් මගින් මේ වන විට කටයුතු සූදානම් කර ඇති බැවින් එම අවට පරිශ්‍රයේ පවතින අඩුපාඩු සියල්ල ම ඒ හරහා සකස් කරන බවට ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටින ලදි.

  මෙහිදී වෙනත් කරුණු කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් සභාවේ සියලු දෙනාගේම එකඟතාවය මත සභාවේ කටයුතු අවසන් කරන ලදි.

- ලබන මස සභා රැස්වීම 2022 වර්ෂයේ පෙබරවාරි මස 18 වන දින ප.ව.2.30 ට යොදා ගනිමු බවට ගරු සභාපතිතුමා ප්‍රකාශ කළ අතර, ඒ සඳහා සභාවේ සියළු දෙනාම එකඟතාවය එල කර සිටින ලදී.

**<u>ගරු සභාපතිතුමා</u>**

සභිකවරුන්ගේ වෙනත් කරුණු ඉදිරිපත් නොවූ බැවින්, ගරු සභාපතිතුමා විසින් අද දින මාසික මහ සභාව සාර්ථක කර ගැනීමට පැමිණි සියලුම මන්ත්‍රීවරුන්, මන්ත්‍රීවරියන් ඇතුළුව පැමිණ සිටි සියලුම දෙනාට ස්තූතිය පුද කරමින් ගරු සභාපතිතුමා විසින් මහ සභාවේ වැඩ කටයුතු ප.ව.5.00 ට පමණ අවසන් කරන ලදී.

- 2022.01.13 දින මොනරාගල ප්‍රාදේශීය සභා කාර්යාලයේදී ය.

ආර්.එම්.රත්නවීර,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
මොනරාගල.

මෙම සභා වාර්තාව ........................................................................ වන දින පැවැති මහ සභාවේ...........................................................................................යෝජනාවෙන් සහ...............................................................................................ස්ථිරත්වයෙන්

ඒකමතිකව/ සංශෝධනයන්ට යටත්ව සභා සම්මත විය.

ආර්.එම්.රත්නවීර,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
මොනරාගල.

| | | | |
|---|---|---|---|
| මුදල් හා ප්‍රතිපත්ති සැකසීම් කමිටුව | තාක්ෂණික සේවා කමිටුව | නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුව | පරිසර හා පහසුකම් කමිටුව |

මෙම සභා වාර්තාව ........................................................................... වන දින පැවැති මහ සභාවේ.................................................................................................................යෝජනාවෙන් සහ.......................................................................................................................ස්ථිරත්වයෙන් ඒකමතිකව/ සංශෝධනයන්ට යටත්ව සභා සම්මත විය.

ආර්.එම්.රත්නවීර,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
මොනරාගල.

1) මොනරාගල, මාගන්දනමුල්ල හි පිහිටි පරාක්‍රම මාවත ලිපිනයෙහි පදිංචි පවුල් 07 ක් පමණ භාවිතා කරන ඉතා අබලන්ව පැවති මාර්ගය ඊයේ දින ඇතිවූ අධික වර්ෂාව හේතුවෙන් ගමන් කිරිමටවත් නොහැකි ලෙස දැඩි සෝදා පාළුවකට පත්ව ඇති බැවින් එම මාර්ගය කුට්ටි ගල් අතුරා ඉතා කඩිනමින් පිළිසකර කර දීම අත්‍යාවශ්‍ය බැවින්, ඒ සඳහා මහ සභා අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාවට යෝජනා කර සිටින ලදී. එම යෝජනාව සුදුසු බවට සනත් ගුණවර්ධන ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරුසභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

පවුල් 07 ක පමණ ජීවත් වන ජනතාවක් මෙම මාර්ගය භාවිත කරන බැවින් කාර්මික නිලධාරි නිලධාරි මහතා යොදවා පරීක්ෂා කර බලා කුට්ටි ගල් අතුරා භාවිතා කළ හැකි පරිදි ඉතා කඩිනමින් සකස් කර දීම සුදුසු බවට මහ සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

2) කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය කිරිම සඳහා යන වියදම සලකා බලා දැනට කිලෝ ග්‍රෑම් 01 ක විකුණුම් මිල වන රු.15.00, රු.20.00 දක්වා ඉහළ නැංවීමටත්, තව ද එක් ගොවියෙකු සඳහා නිකුත් කළ හැකි උපරිම කිලෝ ප්‍රමාණය තීරණය කිරිම සඳහාත් ගරු සභාපතිතුමා විසින් මහ සභාවට යෝජනා කර සිටින ලදී. එම යෝජනාව සුදුසු බවට සන්ධ්‍යා අනුරුද්ධිකා ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරුසභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

මෙම කුඹුරු ඉඩම් හිමිකරුවන්ගේ ඉල්ලීම් පරිදි ඔවුන් එම ඉඩම් සඳහා අදාළ අක්කර බදු ගොවි ජන සේවා දෙපාර්තමේන්තුවට ගෙවන්නේ නම් එම කුඹුරු ඉඩම් සඳහා ප්‍රාදේශීය සභාවේ ලේඛනවල සටහන් කර ඇති වරිපනම් බදු පිළිබඳ තොරතුරු සහ අදාළ බිල් කිරීම් නතර කිරීමටත්, එම දේපල සඳහා මෙතෙක් පවතින රු.407,841.68 ක අය කර ගැනීමට නොහැකි හිඟ මුදල ගරු ආණ්ඩුකාරතුමන්ගේ අනුමැතියට යටත්ව ලේඛනවලින් කපා ඉවත් කිරීම සුදුසු බවට මහ සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

➢ **ගරු සභාපතිතුමන් විසින් හදිසි යෝජනා ඉදිරිපත් කර සිටීම (රීති අංක 11 (8) )**

න්‍යායපත්‍රානුකූලව යථා පරිදී කල්දී ඇති යෝජනා සාකච්ඡා කිරීමෙන් අනතුරුව අද දින සාකච්ඡා කර අනුමැතියක් ගත යුතු හදිසි යෝජනා 01 ක් සම්බන්ධයෙන් මහ සභා අනුමැතිය ලබා ගත යුතු

බවට ගරු සභාපතිතුමා ප්‍රකාශ කළ අතර ඒ සඳහා මහ සභාවේ විරුද්ධත්වයක්ද නොතිබුණු බැවින් ගරු සභාපතිතුමා විසින් එම හදිසි යෝජනා පහතින් දක්වා ඇති ආකාරයට සභාගත කරන ලදී.

a) 2021 වර්ෂයට සභාව සතු සතිපොළ බදු ගත් බදුකරු විසින් ආරම්භක මාසයේ සිට ම රටේ පවතින කොරෝනා වසංගතය හේතුවෙන් සතිපොළ පැවැත්වීම අඩාල වී ඇති අතර, පළමු සතිය තුළ සතිපොළ වසා තබන ලද අතර, දෙවන සතියේ සිට නැවත පොළ විවෘත කළ ද ගොවියන් නිෂ්පාදන රැගෙන ඒම වෙළඳුන්ගේ ප්‍රමාණය සහ සමස්ථ පාරිභෝගිකයන්ගේ පැමිණීම 50%කටත් වඩා අඩු බවත්, නගරයට පැමිණීමට බොහෝ දෙනෙක් අකැමත්තක් දක්වන බැවින් ගොවීන් තම නිෂ්පාදන තම නිවෙස් වෙතින් ම තොග වෙළඳුන්ට විකිණීමේ ක්‍රමවේදයක් ද පවතින නිසා ගිවිසුම්ගත මුදලට සතිපොළ බදු අය කර ගෙන යාම ඉතාමත් අපහසු බැවින්, ගිවිසුම් ප්‍රකාරව මාසිකව සභාවට ගෙවනු ලබන වාරික මුදලින් 50% ක සහන මුදලක් අඩු කර දෙන ලෙස ඉල්ලීමක් කර ඇති බැවින්, මේ සඳහා මහ සභාවේ තීරණය හා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් සභාවට යෝජනා කර සිටින ලදී. එම යෝජනාව සුදුසු බවට තමෝදිරම් ජයසීලන් ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරුසභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

මෙම ඉල්ලීමේ යම් සාධාරණත්වයක් පැවතිය ද මේ මොහොතේ මෙම ඉල්ලීම සඳහා මාසික වාරිකයෙන් 50% අඩු කිරීම සම්බන්ධව තීරණයක් ලබා දිය නොහැකි බවත්, ලබන සතියේ ද සතිපොළ පැවැත්වීම හා වෙළඳුන්ගේ පාරිභෝගිකයින්ගේ පැමිණීම සම්බන්ධව සොයා බලා ආදායම් පරීක්ෂක මගින් සම්පූර්ණ වාර්තාවක් ලබා ගැනීම සිදු කළ යුතු බවටත්, ඒ අනුව ඉදිරියේදී තීරණයක් ගැනීම සුදුසු බවටත් මහ සභාව ඒකමතිකව තීරණය කරන ලදී. සුදුසු බවට මහ සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**අවසන් පිටුවට**

සභිකවරුන්ගේ වෙනත් කරුණු තවදුරටත් ඉදිරිපත් නොවූ බැවින්, ගරු සභාපතිතුමා විසින් අද දින මාසික මහ සභාව සාර්ථක කර ගැනීමට පැමිණි සියලුම මන්ත්‍රීවරුන්, මන්ත්‍රීවරියන් ඇතුළුව පැමිණ සිටි සියලුම දෙනාට ස්තූතිය පුද කරමින් ගරු සභාපතිතුමා විසින් මහ සභාවේ වැඩ කටයුතු ප.ව.6.30 ට පමණ අවසන් කරන ලදී.

- 2021.08.24 දින මොනරාගල ප්‍රාදේශීය සභා කාර්යාලයේදී ය.

ආර්.එම්.රත්නවීර,
සභාපති,
ප්‍රාදේශීය සභාව,

- **හදිසි යෝජනා ඉදිරිපත් කිරීම (රීති අංක 11 (8) )**

න්‍යායපත්‍රානුකූලව යථා පරිදි කල්දී ඇති යෝජනා සාකච්ඡා කිරීමෙන් අනතුරුව අද දින සාකච්ඡා කර තීරණ ගත යුතු හදිසි යෝජනා කිහිපයක් සම්බන්ධයෙන් අවධානය යොමු කළ යුතු බවට ගරු සභාපතිතුමා මහ සභාව වෙත ප්‍රකාශ කර ඒ සඳහා සභාවේ එකඟතාවය විමසා සිටින ලදි.

තවද න්‍යාය පත්‍රය සකස් කිරීමෙන් අනතුරුව අප වෙත ලැබුණු දැනුම් දීමකට අනුව මෙම ව්‍යාපෘතියට අදාල සංවර්ධන කටයුතු 2021 නොවැම්බර් මස 30 වන විට අවසන් කර බිල් පත් ඉදිරිපත් කළ යුතු බව දන්වා ඇති බැවින් මෙය හදිසි යෝජනාවක් ලෙස සභා අනුමැතියට ඉදිරිපත් කරන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

ඒ සඳහා මහ සභාවේ සියලු දෙනාගේ එකඟතාවය ලබා දීමෙන් අනතුරුව ගරු සභාපතිතුමා විසින් පහත යෝජනව ද මහ සභාවට ඉදිරිපත් කරන ලදි.

I. තවද මාර්ග අමාත්‍යාංශය මගින් මොනරාගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය මිලියන 52ක් වෙන් කර ඇති අතර එම ප්‍රතිපාදන මගින් මාර්ග 49ක් සංවර්ධනය කළ යුතුව ඇත.මොනරාගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය මෙන්ම මඩුල්ල, සියඹලාණ්ඩුව, බුත්තල යන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශවල ද මෙම සංවර්ධන වැඩසටහන යටතේ මාර්ග සංවර්ධනය කිරිමේදී රෙඩි මික්ස් කොන්ක්‍රීට් යෙදිය යුතු බවට දන්වා ඇති අතර මෙම බල ප්‍රදේශ 4ටම රෙඩි මික්ස් සපයන ආයතන ඇත්තේ දෙකක් පමණක් බවට ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටි අතර මෙම ආයතන දෙක මගින් මෙම මාර්ග සියල්ලටම රෙඩි මික්ස් සැපයීය යුතු අතර 2021 නොවැම්බර් මසට 30 දිනට පෙර අදාල මාර්ග වල ඉදිකිරීම් අවසන් කර මාර්ග අමාත්‍යාංශය වෙත බිල් පත් ඉදිරිලත් කළ යුතුව ඇත. එබැවින් මෙම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශවලට අයත් සංවර්ධනය කෙරෙන මාර්ග වැඩි ප්‍රමාණයක් පටු බව සහ බෑවුම් සහිත වීම නිසා රෙඩිමික්ස් ප්‍රවාහනයට අපහසු තත්ත්වයක් පවතින අතර කුඩා කොන්ක්‍රීට් මික්චර් යන්ත්‍රය යොදවාගෙන මෙම මාර්ග කොන්ක්‍රීට් කිරීමට සභා අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදී.

එම යෝජනාව සුදුසු බවට සන්ධ්‍යා අනුරුද්ධිකා ගරු මන්ත්‍රීතුමිය විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

මාර්ග අමාත්‍යාංශයෙන් දැනුම් දී ඇති පරිදි අදාල උපදේ හා කොන්දේසි වලට යටත්ව විධිමත් ක්‍රමවේදයන්ට අනුව මෙම ව්‍යාපෘතිවල කටයුතු අදාල දිනට පෙර සිදු කිරීම සුදුසු බවටත්, කුඩා කොන්ක්‍රීට් මික්චර් යන්ත්‍ර යොදවාගනිමින් මෙම මාර්ග කොන්ක්‍රීට් කිරීමට පියවර ගැනීම සුදුසු බවටත් සභාව ඒකමතිකව අනුමත කරන ලදී.